# චීනයේ කොමියුනිස්ට් විප්ලවය
# සහ
# මාඕ සේතුං පිළිබඳ සත්‍ය කථාව

ලි ඔනෙස්ටෝ විසිනි (by Li Onesto)

# චීනයේ කොමියුනිස්ට් විප්ලවය
# සහ
# මාඕ සේතුං පිළිබඳ සත්‍ය කථාව




ලි ඔනෙස්ටෝ විසිනි (by Li Onesto)

***NMSG***
පරිවර්තනයකි

# චින්කාන්ෂාන්

කන්ද පහළ අපේ දද සහ පතාක ලෙළ දෙයි,
ගිරි මුදුනේ අපගේ හොරණෑ සහ බෙර, හඬ දෙයි.
දහස් ගණනින් සතුරා අපව සවිමත් ලෙස වැටලුවද,
අපි අචලව සිටගෙන සිටිමු.
අපේ ආරක්ෂාවට අයෝමය ආවරණයක් ඇත,
අපේ ඒක්සත්කම බලකොටුවක් මෙන් සවිමත්ය.
හුවාංයංචී වලින් ගිනි අවි ගුගුරන මහා නද ඇසේ,
අඳුරට වැදුණු සතුරා පළා යන බව ඇසේ.

1928 වසන්තය

සභාපති මාඕ සේතුං

**Contact with us online:**

**http://slmarxist.yolasite.com**
**slmarxist@ymail.com**

ලි ඔනෙස්ටෝ විසිනි (by Li Onesto)

## 1 කොටස

# චීනයේ කොමියුනිස්ට් විප්ලවය සහ මාඕ සේතුංගේ සත්‍ය කථාව



ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවයේදී- තියෑං මෙන් චතුරස්‍ර ද්වාරය, 1966 අගෝස්තු 18.

1960 සහ 1970 කාලය තුළ ලෝකයේ වඩාත්ම ප්‍රසිද්ධ අයගෙන් කෙනෙකු මාඕ සේතුං විය. විප්ලවයක් ඇති කරන්ට තිබුණු සියලුම විරුද්ධත්වයන්ට එරෙහිව ඔහු චීන ජනතාවට නායකත්වය දී තිබුණි. ඒ දවස්වල විමුක්තිය සහ සාධාරණත්වය සඳහා හැඟීමෙන් සටන් කළ දශලක්ෂ ගණනකට චීන විප්ලවය ප්‍රදීපයක් මෙන් තිබුණි. පීඩිත සහ පීඩකයන්ට, ජාතීන්වලට පංතිවලට කිසිම බෙදීමක් නැති ලෝකයක් සඳහා සටන් කරන්ට, අතරමැදි සමාදනයක් නැති, කවදවත් තැන්පත්මක් නැති, විප්ලවය භාගයකින් නැවැත්වීම සෘජුවම ප්‍රතික්ෂේප කිරීමෙන් මාඕ වඩාත්ම ප්‍රසිද්ධ විය. ජනතාවගෙන් කොටසක් - ගුරුවරු, කම්කරුවෝ, විද්‍යාඥයෝ, ශිෂ්‍යයෝ සහ විප්ලවවාදීහු විවිධ රටවලින් මාඕගේ නායකත්වය යටතේ ගොඩ නැගූ සමාජවාදී සමාජය දැක ගැනීමට චීනයට ගියෝය. සැබෑම විමුක්තිකාමී සමාජයක හැකියාව පිලිබඳව බලාපොරොත්තු සහිතව ප්‍රබෝධමත්ව බොහෝ අය ආපසු සිය රටට පැමිණියහ.

චීනයේ බහුජනතාව තුල මාඕ සම්මානනීය විය. චීන කොමියුනිස්ට් පක්ෂයේ, චීනයේ විප්ලවීය පුරෝගාමී නායකයා වශයෙන් දේශීය ප්‍රතිගාමීන්ට සහ විදේශීය ආක්‍රමණිකයන්ට එරෙහි විමුක්ති යුද්ධයේ අවුරුදු 22 ක් තුළ ජයග්‍රහණයට, ඔහු නායකත්වය දී තිබුණි. වීරෝධාර අරගලයන් හා ශ්‍රේෂ්ඨ නිර්ධන පංතික සංස්කෘතික විප්ලවය අතරේදී සමාජය වෙනස් කරමින් විප්ලවය ආරක්ෂා කරමින් තවත් ඉදිරියට යාමටත්, සමාජවාදී චීනයේ අලුත් ජීවිත සහ අලුත් සමාජයක් ඉදිකරන්ටත් ඔහු ජනතාවට නායකත්වය දුන්නේය. නමුත් චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයේ දක්ෂිණාංශය මාඕට විරුද්ධවී තිබුණි. ඔවුහු මාඕ මෙන්ම, අධිරාජ්‍යවාදීන් චීනයට කළ සැලකීමට කෝපයෙන් දැවෙමින් චීන කොමියුනිස්ට් පක්ෂයට සහ විප්ලවයට එකතුවූ අය වූහ. මාඕ මෙන් ඔවුහුද විමුක්තිය සඳහා විප්ලවය තුල සටන් කලහ. නමුත් මාඕ මෙන් නොවූ ඔවුන්ගේ දර්ශනයන්

කොමියුනිස්ට්වාදයට අවතීර්ණ නොවීය; ඔවුන්ගේ ඉලක්කයන් සැබෑවටම ශක්ති සම්පන්න ජාතියක් බවට චීනය ගොඩ නගනවාට වඩා දුර නොගියේය. ශක්තිමත් සහ නවීන චීනයක් ගොඩනැගීමට ඔවුහු ඉඳුරාම ධනේශ්වර සබඳකම් සහ දෘෂ්ඨීන්ගෙන් යුත් වැඩසටහන් සහ ප්‍රතිපත්තීන් ගෙන ගියහ. 1976 මාඕ මිය ගිය පසු මෙම ''ධනවාදී මග ගත්තන්'' චීන කොමියුනිස්ට් පක්ෂයේ බලය ගෙන දහස් ගණන් මරා දමමින්, ලක්ෂ ගණන් අත්අඩංගුවට ගනිමින් ධනවාදය නැවත ස්ථාපිත කර සමාජවාදය පිස දැමීය. චීන ආණ්ඩුව එය කොමියුනිස්ට් සහ සමාජවාදී ලෙසට දිගටම හඳුන්වා ගත්තද එතැන් පටන් චීනය ධනවාදී රටක් බවට පත්ව ඇත. මාඕගේ ප්‍රතිපත්තීන්, ඔහු පෙනී සිටි දෙය, විනාශ කර දැමූ චීනයේ නව පාලකයෝ, මාඕ ජාතිකවාදී ප්‍රතිමාවක් බවට හරවා ඇත.

එක්සත් ජනපදයේ විශාල කොටසක, සම්පූර්ණයෙන්ම වැඩුණු පරම්පරාවන් දෙකක් අද, මාඕ සේතුං සහ චීනය පිළිබඳව, එක්සත් ජනපදයේ පාලක පංතීන්ගේ රාජ්‍ය තොරතුරු හා ප්‍රධාන මාධ්‍ය ප්‍රවාහයන් හරහා, දැන සිටින සියලුම දෑ වැරදිය. ජනතාවට එරෙහිව දැවැන්ත අපරාධ කර ඇති පාලකයෝ, මාඕ හදවතක් නැති ''බලකාමී ආඥාදායකයෙකු'' බව ජනතාවට කියා ඇත. නමුත් සත්‍යය වනුයේ අධිරාජ්‍යවාදී පීඩකයන්ගේ සැහැසි පාලනයෙන් සම්පූර්ණයෙන් චීනය නිදහස් කරගන්ට, මේ ග්‍රහයාගේ ජනතාවගෙන් හතරෙන් කොටසකට නායකත්වය දී අවුරුදු 25 ක්ම සමාජය විමුක්තිකරණය කරමින් සමාජවාදී සමාජයක් ගොඩනගන්ට කටයුතු කළ ශ්‍රේෂ්ඨ විප්ලවීය කොමියුනිස්ට් වාදියා මාඕ බවයි. මාඕ පිළිබඳව සත්‍ය වටහා ගැනීම සෑම කෙනෙකුටම වැදගත්ය. ඔහු නායකත්වය දුන් විප්ලවය මානව ඉතිහාසයේ ප්‍රධාන වැදගත් සිද්ධියක් බවත්, එවැනි විප්ලවයක් සහ එහි ප්‍රතිරූපය පිළිබඳව සත්‍යයත්, සෑම කෙනෙකුම දැන ගත යුතුය. ඉමහත් අවදානමකට ලක්ව, ලෝකය වෙනස් කරන්ට සත්‍ය ලෙසම උවමනා කරන්නා වූ අයට, අද දින විප්ලවීය ව්‍යාපාරයක් නැවත ගොඩනැගීම කරා දිවීමට, මාඕගේ විප්ලවීය චින්තනය සහ ප්‍රායෝගිකභාවය ඉතා වැදගත් පදනමක් වේ.

මාඕ සේතුං විසින්, චීනයේ නායකත්වය දුන් ලෝක ඓතිහාසික විප්ලවය සහ ඔහු පිළිබඳ සත්‍ය කථාව මෙයයි.

## ''ආසියාවේ රෝගියා'' නැගී සිටියි

බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, එක්සත් ජනපදය, රුසියාව සහ ජපානය විසින් බෙදා ගැනීම සහ ආක්‍රමණය කර තිබුණු චීනයේ 1893 දෙසැම්බර් 26 මාඕ උපත ලැබීය. මේ යටත් විජිත බලවේග චීනයේ දේශපාලනය සහ ආර්ථිකය පාලනය කළේය. ඔවුහු චීන ජනතාවට බල්ලන්ට වගේ සැලකීය. ලෝකය පුරාම ආකර සහ වතු වගා වලට, කුලී ශ්‍රමිකයින් ලෙස පාවිච්චි කිරීමට ඔවුන්ව වට කළේය. විදේශීය හමුදාවෝ සෑම ප්‍රධාන නගරයකම සිටියහ. බ්‍රිතාන්‍යය සහ ඇමෙරිකන් යුද නැව් ජලයේ මුර සංචාරයන්හි යෙදුණි. විදේශීය රටවල් විසින් වරායවල්, තැපෑල, නැව්, දුම්රිය මාර්ග සහ විදුලි පණිවුඩ පාලනය කළේය. විශාල නගරවල පිට්ටනියක (වාහන නතර කරන ස්ථානවල) දැන්වීමක් ප්‍රදර්ශනය කර තිබුණි. ''බල්ලන්ටවත්, චීනුන්ටවත් අවසර නැත'', ෂැංහයි වල කියවිණි. ''ආසියාවේ රෝගියා'' වශයෙන් හැඳින්වූ පරිදිම චීනය පීඩාවට පත්විය.

මාඕ වැඩි වියට පත් වෙද්දී චීනය තුල රදළවාදී ක්‍රමය යටතේ වඩාත්ම දුප්පත් ජනතාව වේදනා විඳිමින් සිටියහ. ඉඩම් වැඩියෙන්ම විශාල ඉඩම් හිමියන්ට හිමිවී තිබුණි. ඉඩම් නැති ගොවි ජනතාවට, යන්තම් ජීවත් වෙමින් රදළයින් සඳහා වැඩ කරන්ට බල කෙරී තිබුණි. ගොවීන් කුසගින්න සහ රෝග, දුප්පත්කමේ තත්ත්වය සහ ඉඩම් හිමියන්ගේ දුෂ්ඨ පාලනයට යටත්ව, ස්ථිරවම ණය බරින් ජීවිත් විය. දරුවන්ව බලා ගැනීමට හැකියාව නොමැති පවුල් ඔවුන්ගේ දරුවන් විකිණීය. ලක්ෂ ගණන් හාමතෙන් මරණයට පත් විය. නගරවල පොදු ජනතාවගේ ජීවිත වඩා හොඳ නොවීය. ෂැංහයි වල සෑම අවුරුද්දකම 25,000 කට වැඩි මළ සිරුරු වීදි වලදී පටවා ගෙන ගියහ. බ්‍රිතාන්‍යය, සහ ඇමෙරිකන් ධනවාදීන් මත් ද්‍රව්‍ය වෙළඳාමෙන් ධනය ලබාගත් අතර දශ ලක්ෂ හැටක චීන ජනතාව මතට හරවමින් බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදීහු අබිං වලින් චීනය යට කළේය. අවුරුද්දෙන් අවුරුද්ද මෙය නැවත නැවත සිදු වෙමින් මානවයා වේදනාවට සහ කාලකණ්ණි තත්ත්වයට පත් කළේය. විනාඩියක් ගන්න,.... මෙය පිටු පස සිටින ජනතාව පිළිබඳව සිතන්න....!

මාඕද ගොවි කැරලි නැග එමින් තිබුණු කාලයක වැඩුණි. 1901 සිට 1910 දක්වා කෝටි ගණන් ජනතාව සම්බන්ධ වෙමින් ස්වේච්ඡාවෙන් කරන ලද අරගල දහසකට ආසන්නව සිදු විය. ශිෂ්‍යයෙක්ව සිටියදී, විප්ලවීය ආණ්ඩුවක් පිහිටු වීමට (1850 සිට 1864 දක්වා) ගොවීන් ආයුධ රැගෙන සිදු කළ තායිපිං කැරැල්ල මාඕ අධ්‍යයනය කළේය. කැරැල්ල මැඩ පැවැත් වීමට බ්‍රිතාන්‍යය, සහ ප්‍රංශයද, එක්සත් ජනපදය සමඟ චීන ආණ්ඩුවද හමුද කණ්ඩායම් යැවූ විට, දශ ලක්ෂ විස්සක් ජනතාව මිය ගිය ආකාරය මාඕ ඉගෙන ගත්තේය. නැවත සිතන්න, ඉහත කී මිනිසුන් සංඛ්‍යාව පිළිබඳව.

මාඕ දොලොස් විය ලබන විට (1906) චීනයේ සියල්ලෝම සාගතයෙන්, ගං වතුරෙන් යුද්ධයෙන් පීඩා වින්දේය. ජනතාවගෙන් කැරැලි කෝලාහල සිද්ධ වෙන විට ඉන් ඔහුගේ මුළු ජීවිතයටම බලපෑ බව මාඕ කීවේය. ආකර කම්කරුවන් සහ ගොවීන් ප්‍රාදේශීය නගර ඔස්සේ ගමන් කර ඉඩම් හිමියන්ගේ ධාන්‍ය ගබඩා වලට කඩා වැදුණෝය. සොල්දාදුවෝ කැරැලි මැඩ පවත්වා, ඝාතනය කළ කැරැලි කරුවන්ගේ හිස් ජනතාවට දැනුම් දීමක් වශයෙන් නගරයේ ගේට්ටු මත තැබූහ. **''එය ගැඹුරු හැඟීමක් මටම ඇති කළේය. මෙම සිද්ධිය බොහෝ දින ගනණක්ම මගේ පාසලේ සාකච්ඡා කළේය. මගේ හිතෙහි එය ගැඹුරු හැඟීමක් ඇති කළේය. අනිකුත් බොහෝ ශිෂ්‍යයන් කැරැලිකරුවන් ගැන අනුකම්පා කළද, එය පරීක්ෂා කරන්නෙකුගේ දැක්මේ කාර්යයක් පමණක් විය. ඔවුන්ගේ ජීවිත වලට ඉන් කිසියම් සම්බන්ධතාවයක් තිබෙන බව ඔවුහු වටහා නොගත්හ. එය පොළඹවන සිද්ධියක් වශයෙන් ඔවුහු හුදෙක් සැලකිල්ල දක්වා තිබුණි. එය මට කවදාවත් අමතක නොවීය. කැරැලි කරුවන් මගේම පවුලේ මෙන් සාමාන්‍ය ජනතාව බව මට හැඟුණි. ඔවුන්ට දෙනු ලැබූ සැලකීමේ අයුක්තිය මම ගැඹුරින් හෙලා දැක්කෙමි.''** මාඕ කීවේය.

ඔවුන්ගේ වීරත්වය සහ පරිත්‍යාගය කෙසේ වූවත් මෙම කැරලි මූලික ආකාරයකින් සමාජය වෙනස් කිරීම සහ ප්‍රශ්න සත්‍ය ලෙසම විසඳීමේ අසමත්භාවය ඔප්පු කර තිබුණි. ඔහුගේ බොහෝ උත්සාහයන් මෙන් ඉදිරියට යා යුතු ආකාරය සොයන්ට මාඕ අධිෂ්ඨාන සහගත විය. 1909 දී අවුරුදු 16 දී ගුරුවරයෙක් වීමට

පාසැලකට යාමට මාඕ ගෙදරින් ගියේය. ''ලෝකයේ සිතියමක් මම දැකපු පළමු වතාවේම විශාල උනන්දුවකින් අධ්‍යයනය කළෙමි.'' මාඕ කීවේය. බොහෝ රටවල දර්ශනිකයන් සහ අනිකුත් රටවල ඉතිහාසය මාඕ අධ්‍යනය කළේය. ඔහු චීනය පුරාම සියළුම පුවත් පත් සියුම්ව පරීක්ෂා කළේය. පළමු වතාවට කාල් මාක්ස්ගේ ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' කියවීය. 1817 දී මාඕ ''නව මිනිසාගේ අධ්‍යයන සමාජය'' ට අත්තිවාරම දැමීය. මෙම කණ්ඩායමේ තරුණ ක්‍රියාකාරීහු අබිං බීමට, සූදුවෙහි යෙදීමට, බීමට, ස්ත්‍රීන් සමඟ අනාචාරයේ යෙදීමට, සහ දූෂණයට විරුද්ධ විය. කාන්තාව පීඩනයට පත් කිරීමට විරුද්ධ විය. කාන්තාවන් නිදහස් පුද්ගලයන් විය යුතු බවට මාඕ තර්ක කළේය. ''කාන්තාවන් විමුක්තියට පත් කරන්නේ නැත්නම් මිනිසුන්ට නිදහස් විය නොහැක.'' මෙම කණ්ඩායම කම්කරුවන් සඳහා සවස පංති ආරම්භ කළ අතර, මාඕ එහි ඉතිහාසය ඉගැන්නුවේය. වර්තමාන කටයුතු සාකච්ඡා කළේය. කම්කරුවන්ට පුවත් පත් කියෙව්වේය. ඔහුගේ පංතිවල කියවීම ප්‍රසිද්ධ කළ දැන්වීමක් වූයේ, ''නුඹට උවමනා නම් නුඹට පැලැඳිය හැකි කිසියම් ඇඳුමක් පැලැඳ, සරල කථාවෙන් හතරෙන් එකක් අසන්නට එන්න'' යනුවෙනි.

## රුසියාවෙන් වෙඩි හඬ

1917 දී බොල්ෂෙවික්වරු රුසියාවේ බලය අත්පත් කර ගෙන නව සමාජවාදී රාජ්‍යයක් පිහිටෙව්වේය. ලෙනින් නායකත්වය දුන් එම විප්ලවය ලෝකය පුරාම බලවත් කම්පන යැව්වේය. සිදු වෙමින් තිබුණ යටත් විජිත විරෝධී, අධිරාජ්‍ය විරෝධී අරගල සමග සම්බන්ධ වුණු එය අනික් රට වලටද කොමියුනිස්ට්වාදය පැතිරෙව්වේය. චීනයේ බහු ජනතාවගේ බොහෝ පරම්පරාවන් විමුක්තිය මුදුන් පත් කර ගන්නා ආකාරය නොදැන, සැලැස්මක් නැතිව, නායකත්වයක් නැතිව, න්‍යායක් නැතිව ඉහත සටන් කර තිබුණි. නමුත් දැන් ඔක්තෝබර් විප්ලවයේ වෙඩි හඬ චීනයට මාක්ස්-ලෙනින් වාදය ගෙනාවේය. මාඕ එය ඉදිරියට දැමීය.

පළමුවන ලෝක යුද්ධය දිනූ අධිරාජ්‍යවාදී බලවේගයෝ, යුද්ධයෙන් පසු ජර්මනියට අයත්ව තිබූ චීනයේ යටත් විජිත අයිතීන්, ජපානයට පවරා දුන්නේය. 1919 මැයි 04 ප්‍රධාන නගරය වූ බීජිං හි ශිෂ්‍යයෝ තුන්දහක් මෙම තීරණයට විරුද්ධත්වය පැහැදිලි කළේය. යුද නීතිය ප්‍රකාශ කර, පොලීසිය සහ හමුදාව ජනතාව අත් අඩංගුවට ගැනීමට පටන් ගත්තේය. ශිෂ්‍යයෝ පාසැල්වල ප්‍රසිද්ධ වැඩ වර්ජනයක් කරන ලෙස ඉල්ලා සිටියේය. මේ වැඩ වර්ජනය ඉක්මනින්ම ෂැංහයි කේන්ද්‍ර කරගෙන කම්කරුවන් 90,000 ක් සම්බන්ධ කර ගනිමින් ෆැක්ටරි සහ සමාගම් සියයකට වඩා වසා දැමිණි. නව ජනතාවගේ අධ්‍යයන සමාජයේ මාඕ සහ අනිකුත් සාමාජිකයන් මෙම මැයි 04 ව්‍යාපාරය පිළිබඳව ඇසූ විට, ඔවුහු වැඩ වර්ජනය කරන ලෙස ඉල්ලා හූනානයේ ශිෂ්‍ය සංගමයක් පිහිටෙව්වේය. 1919 අවුරුද්ද පුරාම මෙම අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය චීනය පුරාම පුලුල්ව පැතිරී දශ ලක්ෂ ගණන් ජනතාව දේශපාලනික කළේය.

මුලින්ම කාන්තාවන් රදළ සම්ප්‍රදයෙන් පීඩාවට පත් කර ඇති ආකාරයට විරුද්ධව මාඕ කථා කළේය. 1919 නොවැම්බර් මස 14 දින කාන්තාවක්, විවාහ යෝජනාවකට දේලාවකින් රැගෙන යෑම නිසා, ඇගේ උගුරු දණ්ඩ කපා ගත්තාය.

මාඕට මේ පිළිබඳව ඇසුණු විට, සමාජයේ මේ දුක්ඛ දයක තත්ත්වයේ පිළිබිඹුවට චෝදනා කරමින් ලිපි 10 ක ලිපි පෙළක් ප්‍රසිද්ධ කළේය. කාන්තාවන්ට මිනිසුන්ට වඩා ඔවුන්ගේ පිට මත පීඩනය වඩා වැඩි වෙයි. මිනිසුන්ට පෙරලා දමන්ට සූරා කෑමේ කඳු 3 ක් ඇත. කාන්තාවන්ට හතරකි. මිනිසාද ඇයව සූරා කයි. එනිසා කාන්තාව අති විශාල, ශක්ති සම්පන්න විප්ලවීය බලවේගයකැයි මාඕ කීවේය. මාඕ ගේ මෙම මූල ධර්මය ''මානව වර්ගයා මත ඇති සෑම යදමක්ම කඩා බිඳ දැමීමට, ඔහුට ඇති දැවෙන ආශාව'' ඔහුගේ මුලු ජීවිතය පුරාම රැඳී පැවතුණි.

1921 දී මාඕ චීනයේ කුඩා මාක්ස්වාදී කණ්ඩායමක් සමග එක්ව චීන කොමියුනිස්ට් පක්ෂය පිහිටෙව්වේය. මාක්ස්-ලෙනින් වාදය මතවාදය ලෙස ඔසවා ගනිමින්, ඔවුන් චීනය වැනි රටක විප්ලවය දියත් කිරීමේ න්‍යායික සහ ප්‍රායෝගික ගැටළු නිරාකරණය කරන්ට පටන්ගෙන තිබුණි.

1921 දී මාඕ, කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකාවක වූ යැංග් කායිහුයි (Yang Kaihui) විවාහ කර ගත්තේය. 1927 දී කුවෝමින්තානය ඇයව අත් අඩංගුවට ගෙන, ඇගේ විප්ලවීය දේශපාලනය සහ මාඕ සමග විවාහය අත් හැරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු මරා දැමෙන තුරු ඇය විප්ලව වාදිනියක්ව සිටියාය. 1961 දී මාඕ යැන්ග් කායිහුයි අනුස්මරණය කිරීමට, ඔහුගේ වඩාත්ම ප්‍රසිද්ධ කවි අතර වූ ''ප්ලම් පුෂ්පයට'' ("Ode to the Plum Blossom") නැමැති කවි පංතිය ලීවේය.

## ප්ලම් පුෂ්පයට

සුළඟ සහ වැස්ස පිරිවරා, වසන්තය ඇරඹෙයි.
හිම තුෂාර පියාඹමින් වසන්තයේ උදව වෙත පෙර ගමන් යයි.
ඍජුව ඉහළ නැගුණු අයිස් පර්වතය මත,
සුන්දර, කදිම මලක් පිබිදෙයි.

සුන්දර, නිමල ඇය, ඇයට පමණක්ම වසන්තය නොපතයි.
වසන්තයේ දූතයා නිසා ඇය ප්‍රමුදිත වෙයි.
කඳු වැටි මල් පොහොට්ටුවලින් පිරී ගත් කළ,
ඒවා අතරින් මතුවී, ඇය සිනාසෙයි.

## විප්ලවය ඇරඹේ

මේ අතර කාලයේ ගොවීන් ස්ව කැමැත්තෙන්ම නැගී සිටීමෙන් පසු විප්ලවය ඇරඹේ. ඔවුහු දූෂිත නිළධාරින්ට සහ ඉඩම් හිමියන්ට පහර දෙමින් ඉඩම් බලයෙන් අත් කර ගත්තෝය. 1925 දී මාඕ හූනාන පළාතේ ගමෙන් ගමට ඇවිදගෙන ගියේය. ඔහු ගොවීන් සමග නැවතුණු අතර ඔහුගේ ආහාර වේල හා නවාතැන සඳහා වැඩ කළේය. ඔහු වාඩිවී ඔවුන්ගේ ජීවිත කොයි වගේද යන්න දැන ගැනීමට, කෙලින්ම ලැබුණු ආරංචි පරීක්ෂා කරමින් ඔවුන්ට කන් දුන්නේය. බොහෝ ගොවීන් පක්ෂයට බඳවා ගන්ටත්, ගොවි සමිති පිහිටු වන්ටත් ඔහු උදව් කළේය.



පළමු මූල ප්‍රදේශය වන චින්කාං (Chingkang) කඳු වැටියේ දී විප්ලවීය හමුදාව මෙහෙයමින්.

චීන කොමියුනිස්ට් පක්ෂයේ සමහර නායකයින්ට ගොවීන් ගතානුගතික සහ පසුගාමී වශයෙන් ලියන්ට උවමනා වී තිබුණි. මේ දැක්මට විරුද්ධව අරගල කළ මාඕ, දුප්පත් ගොවීන් නොමැතිව විප්ලවයක් නොමැති බවට තර්ක කළේය. ගොවි නැගී සිටීම් වලදී කථා කරමින් ඔහු කීවේ සෑම විප්ලවීය පක්ෂයක්ම සහ සෑම විප්ලවීය සහෝදරයෙක්ම ඒවායේ තීරණය පරිදි, ප්‍රතික්ෂේප කරන්ට හෝ පිළිගන්ට, පරීක්ෂණයට භාජනය වේවි. **තෝරාගත හැකි ක්‍රම තුනකි. ඔවුන්ගේ ඉදිරියෙන් ගමන් කරන්ට සහ නායකත්වය දෙන්ට, විවේචනය කරමින් සහ අංග චලනය කරමින් ඔවුන් පිටුපස ගාටන්ට, ඔවුන්ගේ ගමනට හරස් කපමින් ඔවුන්ට විරුද්ධ වන්ට, ඔහු කීවේය.**

චීනයේ මූලිකවම ජාතිකවාදීව තිබුණු පක්ෂයක් වන කුවෝමින්තානය (KMT) විදේශ පාලනයට විරුද්ධව සහ චීනයේ නිදහස සඳහා සටන් කළ සංවිධානයක් විය. නමුත් 1920 දී චියැං කායි ෂෙක් විසින් එය බාර ගැනීමත් සමග චීනයේ ඉඩම් හිමියන්, ලොකු ධන පතියන් සහ අධිරාජ්‍ය වාදීන් සඳහා වාහනයක් බවට එය හැරවීය. එයට විශේෂයෙන් චීනය අර්ධ යටත් විජිත තත්ත්වයේ පවත්වා ගෙනයන්ට උවමනාවූ බ්‍රිතාන්‍ය හා එක්සත් ජනපදයේ අනුබලය තිබුණි. 1927 දී විප්ලවීය ව්‍යාපාරය සහ කොමියුනිස්ට් පක්ෂය විනාශ කර දැමීමේ ඉලක්කයෙන් බොහෝ යුධ ව්‍යාපාරයන් කුවෝමින්තානය දියත් කළේය. කුවෝමින්තානය නගරවල වැඩ වර්ජන කරන්ට අයිතිය, කම්කරුවන්ගේ සංවිධාන, මුද්‍රණාල, දේශපාලන රැස්වීම් තහනම් කළේය. දහස් ගණන් කම්කරුවන් මරා දැම්මේය. කොමියුනිස්ට් වාදීන් සහ කොමියුනිස්ට් වාදීන්ට අනුකූලතා දක්වන්නන් වටකර අල්ලා ගෙන ප්‍රසිද්ධියේ මරා දැම්මේය. මේ කාරණයෙන් චීනයේ ස්ථාවර හා ඒකීය ජාතික ආණ්ඩුවක් නොවීය. රටේ සමහර කොටස්වල යුද අධිපතියන්ද (යුදවාදී ඉඩම් හිමි කල්ලි), අනෙක් ස්ථානවල කුවෝමින්තානයද පාලනය ගෙන යමින් තිබුණි (විවිධාකාරයේ කල්ලි කුවෝමින්තානයට විය). මේ සියළුම ලේ වැගිරීම් වලින් චියැං කායි ෂෙක් නැන්කිං නගරයේ කුවෝමින්තාන් ආණ්ඩුව පිහිටවූ අතර ඒ එක්කම බටහිර අධිරාජ්‍යවාදීහු එය චීනයේ එකම සහ නීත්‍යානුකූල ආණ්ඩුව වශයෙන් පිළිගත්තේය.

මේ අතර ගම්බද යුද අධිපතියෝ ගොවියන් මරා දැමූහ. කැරැලිකාරී කාන්තාවන් තෝරාගෙන කෑලිවලට කපා දැමීම හෝ පණපිටින් පිළිස්සීම සිදු කළහ. එක ප්‍රදේශයක මාස 5 ක් තුළ කාන්තාවන් 500 ක් ඇතුළුව ගොවීන් 4,700 ක්, හිස් ගසා දැමීම, පණ පිටින් වළලා දැමීම, ගෙල මිරිකීම හා කැබලි වලට කපා

පිලිස්සීම මගින් ඝාතනය කළහ. ගොවීන් විසින් උදුරාගත් ඉඩම් නැවත ඉඩම් හිමියන් අතට පත් විණි. ගොවි සහ කම්කරු නායකයින් වට කර තබා වෙඩි තැබූහ. හූනාන් පළාතේ එක් අවුරුද්දක් තුළ ගොවීන් සහ කම්කරුවන් ලක්ෂයකට වඩා මරා දැමූහ. පක්ෂයට අඩු තරමින් සාමාජිකයින් 15,000 ක් වත් අහිමි වූහ.

## ගම්බද පෙදෙස් වල විප්ලවය



1936 - උතුරු සෙන්සි (North Sensi) වලදී.

1928 කොමියුනිස්ට් පක්ෂය සහමුලින් වනසා දැමූ අතර පක්ෂයට නගරවල රහසිගතව වැඩ කිරීමට සිදු විය. මේ විශාල පරාජය විසින්, විප්ලවීය න්‍යාය කඩා බිඳගෙන යාමට සහ තව දුරටත් විග්‍රහයක් කිරීමට බල කෙරී තිබුණි.

සෝවියට් සංගමයේ නිර්ධන පංති විප්ලවය, සිවිල් යුද්ධයේදී යුද්ධෝපායක් ලෙස නගරවල කැරලි ඇති කිරීම අනුගමනය කර තිබුණි. චීන විප්ලවයද මේ ආකාරය ම ගතයුතු බව සමහරු තර්ක කළහ. නමුත් මේ පරාජයත් සමග නගරවල කැරැලි ඇති කිරීමේ උත්සාහයන් වේදනා ගෙන දී තිබුණි. චීනය වැනි විශාල පීඩිත රටක වැඩ, මෙය විය යුතු නැති බව මාඕ දැක්කේය. නගරවල බලය අල්ලන්ට, පවත්වා ගෙන යාමට කම්කරුවන් ගේ උත්සාහයන් නිශ්ඵල වෙන බවත්, වීරත්වය කාර්යය නොවන බවත්, නගරවල ප්‍රති විප්ලවය ශක්තිමත් බවත් මාඕ හඳුනා ගත්තේය.

විප්ලවයට දේශපාලන බලය තහවුරු කරගත හැකි ගම්බද ප්‍රදේශ වල විහිදුණු මූල ප්‍රදේශ බිහි කිරීමෙන් විප්ලවය ආරම්භ කරන්නට පුළුවනි, මාඕ තර්ක කළේය. සතුරාට විරුද්ධ යුධමය අරගලය, නව විමුක්තිකාමී සමාජයක බීජ වපුරමින්, කෘෂි කාර්මික විප්ලවයට සම්බන්ධවී බැඳී තිබේ. මෙයින් අදහස් කරන්නේ කොමියුනිස්ට් වාදීන්ට, ඉඩම් ප්‍රතිසංස්කරණයට ජනතාවට නායකත්වය දීම සහ දේශපාලනිකව සන්නද්ධ කිරීම, නව ආකාරයේ මහජන යුද්ධයක් ඇරඹීම, සුළු ජාතික හා කාන්තා පීඩනයට එරෙහිව අරගල කිරීම සහ ජනතාව අතර නව ආකාරයේ විප්ලවීය සංස්කෘතියක් ඇති කිරීමට හැකි බවයි. මෙ ලෙසට මූල

ප්‍රදේශ වලට ජනතාව අතර සහයෝගය වවාලන මධ්‍යස්ථාන ලෙස සේවය කළ හැක. විප්ලවයට අවසානයේ නගර වට කොට බලය අල්ලා ගැනීමෙන් ජාතික මට්ටමේ බලයක් ගොඩ නැගිය හැක. මේ අරමුණ සහ උපාය මාර්ගය සමඟ **''ජනතාවගේ හමුදවක් නොමැතිව ජනතාවට කිසිවක්ම නැත''** මාඕ කීවේය. නව රතු හමුදවක් පිහිටවූහ.

ශික්ෂිත හා දේශපාලනිකව විශුද්ධභාවයක් ඇති හමුදවක් ගොඩ නගන්ට මාඕ ප්‍රතිපත්ති සංවර්ධනය කළේය. රතු හමුදව නගරයකට ඇතුළු වුණු විට වහාම මාඕ එහි පදිංචිකරුවන් ඇමතීමට රැස්වීමක් කැඳවන්නට යෙදුණි. නමුත් මෙය සෑම විටම පහසු නොවීය. නගරයකදී ජනතාව කඳුකරයට පලා ගොස් පඳුරු තුළ සැඟවුණි. මෙය සාමාන්‍ය පිළිවෙල විය. යුද අධිපතින්ගේ සහ අධිරාජ්‍යවාදීන්ගේ හමුදවල සාමාන්‍ය සෙබලුන් ස්ත්‍රීන් දූෂණය කරන්ටත්, මංකොල්ල කන්ටත් පුහුණු කර තිබීමෙන්, වේදනා ලද ඔවුහු හමුදවක් පැමිණෙන විට පලා ගියහ. නමුත් මාඕ ඔහුගේ හමුදවන්ට කිසිම දෙයක් නොගන්ටත් ගෙදරකට ඇතුල් නොවන්ටත් නියෝග කර තිබුණු අතර මංකොල්ලකාරී කල්ලි, රදළ සහ ධනපති හමුදවන්ගේ දූෂණය සහ මංකොල්ලකාරී මානසිකත්වය රතු හමුදව තුළ දේංකාර දීමේ සෑම චින්තනයකටම එරෙහිව ඔහු ඉතා දුෂ්කර අරගලයක් ගෙන ගියේය. එහෙයින් රතු හමුදවේ සොල්දදුවන්ගේ ආචාර සම්පන්න හැසිරීම ඉතාම අසාමාන්‍ය විය. තුන්වෙනි දවසේ ප්‍රාදේශීය ජනතාව ඔවුන්ගේ ආරක්ෂිත ස්ථානවලින් සෝදිසියෙන් බලමින් බෑවුම් මතින් ආපසු ආවේය. ආපසු එන්ට ඔවුන්ව උනන්දු කරවමින් මාඕ ඔවුන්ට කථා කළේය. ඉඩම් හිමියන්ගෙන් ලබාගෙන තිබුණු ඇඳුම් සහ මුදල් ඔහු බෙද දුන්නේය. රතු ධජය සහිත මේ හමුදව ඔවුන්ගේ විමුක්තියට වෙන්වූ, ඔවුන්ගේ කටයුතු වලට කැපවූ ඔවුන්ගේම හමුදව බව මාඕ ජනතාවට කීවේය. ගොවීන් රතු හමුදවට නවාතැන්දී පෝෂ්‍ය කළේය. ඔවුන්ගෙන් සමහර දෙනෙක් විප්ලවීය හමුදවට එකතු විය. ගම්බද ප්‍රදේශ හරහා මාඕගේ නායකත්වය යටතේ රතු හමුදව ගමන් කිරීමෙන් මේ දර්ශනය නැවත නැවත සිදුවිය.

මේ සෑම වෙලාවෙහිම මාඕ චීනයේ සහ අනිකුත් යුද්ධ සියල්ල මෙන්ම සෝවියට් සංගමයේ විප්ලවීය යුද්ධයේ ඉතිහාසය සහ අනෙකුත් යුධමය න්‍යායන් අධ්‍යනය කිරීමද සිදු කළේය. 1930 දශකය අවසානයේදී විස්තීර්ණ මාක්ස්වාදී යුධ නියමයන් සහ යුධ කටයුතු වල චින්තනයේ පර්යායන් පළමු වරට මාඕ සංවර්ධනය කළේය. විප්ලවීය යුද්ධයේ සාර්ථකත්වය රඳා පවත්නේ බහු ජනතාව මත බවත්, අරගලයට ඔවුන් ක්‍රියාත්මකව බඳවා ගැනීම සහ ඔවුන්ගේ සහයෝගය මතය යන්න, බව මුල්බැස ගැනීම මෙම මතවාදය විය.

මාඕගේ යුධමය චින්තනය මුළුමනින්ම විද්‍යාත්මක විය. රතු හමුදව පටන් ගැන්මේදී රජයේ හමුදවන්ට වඩා දුර්වල බැවින් කඩිනම් ජයග්‍රහණයක් ලද නොහැකි යැයි ඔහු තර්ක කළේය. ශක්තිය මැනීමෙහි තීරණාත්මක පරීක්ෂාවන් මග හරිමින්, ගරිල්ලා යුද්ධයෙහි යෙදෙමින්, වඩා කුඩා ගැටුම්වලදී දුර්වල සතුරු කණ්ඩායම් පරාජය කොට, දිග්ගැස්සුණු වැඩ පිළිවෙලක් ඔස්සේ, මහ ජන සහයෝගය ලබාගෙන, ශක්තියෙන් සහ සංඛ්‍යාත්මකව දියුණු වෙමින්, චීනයේ විප්ලවීය හමුදවන්ට ඔවුන්ගේ පාලනය පළල් කළ හැකිය. එය ගම්බද ප්‍රදේශවල

දිග්ගැස්සුණු යුද්ධයේ උපායික ක්‍රියා මාර්ගයන් දිගටම පවත්වා ගෙන යෑමට, අනුක්‍රමයෙන් ශක්තියේ අසමාන වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වේ, මාඕ කීවේය. මේ ආකාරයට ගරිල්ලා යුද්ධයේ බොහෝ, විවිධවූ ප්‍රතිපත්ති මාඕ සංවර්ධනය කළේය: **''සතුරා ආක්‍රමණය කරන විට අපි පසු බසින්නෙමු. සතුරා විවේක ගන්නා විට අපි හිරිහැර කරන්නෙමු. සතුරා දුර්වල විට අපි පහර දෙන්නෙමු. සතුරා පසු බසින විට අපි ලුහු බඳින්නෙමු.''**

## දිගු පාගමන (Long March)



*අනභිභවනීය රතු හමුදාව රාත්‍රීයේ ගමනේ යෙදෙමින්.*

1932 ජපානය, චීනය ආක්‍රමණය කළේය. ''සියල්ලෝම මරනු, සියල්ලෝම පුලුස්සනු'' යුද ව්‍යාපාරයක් අවුරුද්ද පුරාම ජපන්නු දියත් කර දශ ලක්ෂ 30 ක් චීන ජනතාව මරා දැම්මෝය. 1937 දෙසැම්බර්වල ජපන් බල ඇණි නැන්කිං වලට ඇතුල්වී 50,000 ක භට කණ්ඩායමක් මිනීමරන්ට මංකොල්ලකන්ට, ස්ත්‍රීන් දූෂණය කරන්ට ලිහා දැම්මේය. සති හතරක් තුල තුන් ලක්ෂයක් (3,00,000) ජනතාව මරා දැම්මෝය. ජපන් සොල්දදුවෝ කුඩා දරුවන්ගේ හිස් ගසා දැම්මෝය. වයස ස්ත්‍රීන් සහ තරුණ ගැහැණු ළමයින් ඇතුළුව කාන්තාවන් දහස් ගණනක් දූෂණය කළෝය. දහස් ගණන් මිනිස්සු පේලියට සිටවා මැෂින් තුවක්කු වලින් වෙඩි තැබුවෝය. චීනයේ කණ්ඩායම් බයිනෙත්තුව පුහුණු කිරීමට භාවිතා කළෝය. අනිත් අයව පහන් නිවා දමා භූමිතෙල් සමග පණ පිටින්ම පිළිස්සුවෝය. චීන ජනතාවගේ විරෝධය පාගා බිඳ දැමීම සහ චීන ජනතාව සම්පූර්ණයෙන්ම යටත් කර ගැනීම අරමුණු කළ මෙය උමතු, කෲර යුද්ධයක් විය.

කොමියුනිස්ට් වාදීන්ට පහර දීම හැර චියාං කායි ෂෙක් ඔහුගේ භට කණ්ඩායම් රැස් කිරීම ප්‍රතික්ෂේප කළ අතර කොමියුනිස්ට් වාදීහු ජපනුන්ට එරෙහිව සටන් කරන්නට ජනතාවට නායකත්වය දුන්නේය. අධිරාජ්‍ය වාදීන්ගේ අනුබලය ලැබූ චියාංගේ කුවොමින්තානය රතු හමුදවට විරුද්ධව දැවැන්ත ආක්‍රමණයන් දියත් කළේය. 1933 දී කුවෝමින්තානය යුද ටැංකි, ගුවන් යානා ඇතුළුව දශ ලක්ෂයක භට කණ්ඩායමක් රතු හමුදවට එරෙහිව එක් රැස් කළේය. 1934 ඔක්තෝබර් 16 මාඕ සහ රතු හමුදව විසින්, විශ්මය ජනක දිගු පාගමන ආරම්භ කළ අතර කියැංසි වලින් උපායික පසු බැසීමකට බලකර තිබුණි.

මාඕගේ නායකත්වයෙන් යුත් රතු හමුදාව පෘථිවියේ වඩාත්ම උපද්‍රව සහිත බිම් පෙදෙස් සමහරක් හරහා සැතපුම් 6,000 කට වඩා ගමන් කළේය. දශ ලක්ෂ 200 ක් ජීවත්වූ පලාත් 12 ක් හරහා ඔවුහු ගමන් කළහ. කඳු වැටි 18 ක් සහ ගංගා 24 ක් තරණය කළහ. ප්‍රධාන නගර සහ නගර 62 ක් අත්පත් කර ගත්හ. දශ ලක්ෂයක් කුවොමින්තාන් සොල්දාදුවන්ට පහරදීම් සහ සටන් කළහ. දහවල් 235 ක් සහ රාත්‍රී 18 ක් ගමන් කළ අතර සාමාන්‍යයෙන්, ආසන්න වශයෙන් සෑම දිනකම සුළු සටනක් කළහ. ''**එය බොහෝ බීජ වපුරා ඇත. ඒවා දළු කොළ දමාවි. මල් පිපේවි, පළතුරු ඵල දරාවි. අනාගතයේදී අස්වැන්නක් ලබාදේවි.**'' ඔහු කීවේය.

දිගු පාගමනේ මාස තුනකට පසු 1935 මාර්තු වලදී රතු හමුදාව වෙව්චොව් (Kweichow) පළාතේ සුන්යි (Tsunyi) වලට ලගාවිය. මෙහිදී කොමියුනිස්ට් පක්ෂයේ නායකයෝ තීරණාත්මක හැරවීමකට හරවා ගත් ඉතා වැදගත් සමුළුවක් පැවැත්වූහ. පළමු වතාවට පක්ෂය මාඕගේ දේශපාලන, යුධමය මූලෝපායන් මත ඔහුගේ සමස්ත නායකත්වය යටතේ සමගි විය. සුන්යි වලින් රතු හමුදාව ඉවත් වන විට ප්‍රදේශයෙන් ගොවීහු 4,000 ක් පාගමනට එකතු වූහ.

1935 ඔක්තොබර් 20 කියැන්සි (Kiangsi) වලින් ඉවත්වී අවුරුද්දකට පසු උතුරු සෙන්සි (Shensi) ප්‍රදේශයෙන් දිගු පාගමන අවසන් කළහ. රතු භටයින් ලක්ෂයකින් ඇරඹි දිගු පාගමන 20,000 කින් අවසන් කළහ. දිගු පාගමන උපායික පසු බැසීමක් වූ අතර එය පරාජයක් නොවීය. රතු හමුදාව මුළුමනින්ම පෙර නොවූ විරූ දේශපාලන ශක්තියෙකින් සිය නායකත්වය සමඟ අලුත් මූල ප්‍රදේශයට ලගා විය.

කොමියුනිස්ට් වාදීහු, ඔවුන් ජපාන ආක්‍රමණිකයන්ට එරෙහි හොඳම සටන් කරුවන් බව ඔප්පු කළහ. 1926 දී කුවෝමින්තානය සහ කොමියුනිස්ට් පක්ෂය ජපාන ආක්‍රමණිකයන්ට එරෙහිව එක්සත් පෙරමුණක් සෑදිය යුතු බවට මාඕ තර්ක කළේය. නමුත් චියැං කායි ෂෙක්, කුවෝමින්තානයේ ප්‍රධානියා කොමියුනිස්ට් වරුන්ට විරුද්ධව සිටි අතර, ඔහුගේ ආයුධ සහ සොල්දාදුවෝ ආරක්ෂා කරගෙන සිටියේය. 1937 සහ 1945 අතර ජපානය සමඟ යුද්ධයෙන් සියයට හැත්තෑවක්ම රතු හමුදාව සිදු කළහ. රතු හමුදාව 92,000 ක් යුද සටන් කළහ. සතුරු හමුද භටයින් දශ ලක්ෂයක් මරා දැමූහ. 1,50,000 ක් සිර කරුවෝ අල්ලා ගත්හ.

## කොමියුනිස්ට් සිද්ධාන්ත සංවර්ධනය කිරීම

නමුත් මේ කිසිවක් ඕපපාතිකව සිදුවූවා නොවේ. විප්ලවයේ ගැටළු විසඳන්ට සහ එහි ගමන් මග හසුරුවන්ට මාඕ න්‍යාය සංවර්ධනය කළේය. මේ සියල්ල ඔස්සේ කොමියුනිස්ට් වාදයේ විද්‍යාවට වැදගත් සහ අවශ්‍ය අලුත් ඉගැන්වීම් ඔහු බිහි කළේය. මේ කාලය අතරතුරේදී මාඕ අධිරාජ්‍ය වාදීන්ගේ පීඩනයට පත් ජාතියක විප්ලවය ඇති කරන්ට, උපායික ප්‍රශ්න, යුදමය කටයුතු සහ දර්ශනයෙහි ගැටලු නිරාකරණය කළේය. ඔහුගේ වැඩ අතර වූ ''ප්‍රතිවිරෝධය ගැන'' (On Contradiction), ''භාවිතාව ගැන'' (On Practice), ''නව ප්‍රජාතන්ත්‍රවාදය ගැන'' (On New Democracy) සහ තවත් බොහෝ න්‍යායික ලිපි



*සභාපති මාඕ අධ්‍යයනයේ යෙදෙමින්.*

ලෝකය පුරා සියළුම විප්ලව වාදීන්ට අධ්‍යයනය කිරීමට ඉතා වැදගත් දයකත්වයක් සැපයූ අතර, ඔවුන්ගේ වැඩ පවත්වාගෙන යාමට අදටත් වැදගත්වේ. එපමණක් නොව මේ ප්‍රශ්න නිරාකරණය කිරීමේ ප්‍රවේශය සහ විධි ක්‍රමයේ ආකාරය දැනගන්ට වැදගත් දෙයත් එයම වේ. මේ සියලු න්‍යාය ඔහුට මුල් බැස ගැනීමට එක්තරා වැදගත් සම්මානනීය සම්මතයන්ගෙන් කැඩීමටද අත්‍යවශ්‍ය බවත් ඔහු සොයා ගත්තේය.

1939 අවසානයේදී ඔහු ''නව ප්‍රජාතන්ත්‍රවාදය ගැන'' ලිපිය ලීවේය. චීනයේ විශේෂිත ප්‍රශ්නය සම්බන්ධයෙන්, දශක කිහිපයක්ම අධිරාජ්‍යවාදී බලවේග චීනය පාලනය කර තිබීමත්, ආර්ථිකය පරාධීන සහ විකෘති කර තිබීමත් නිසා නිදහස් ජාතියක් ලෙස චීනය කිසි කලෙක සංවර්ධනය නොවුණු බව ඔහු පෙන්වා දුන්නේය. අධිරාජ්‍යවාදී සංවර්ධනය චීනයේ වඩාත් පසුගාමී නිෂ්පාදන සම්බන්ධතාවයන් වෙනස් කරන්ට නායකත්වය දී තිබුණි. නමුත් රදළ සහ අර්ධ රදළ ආර්ථික සම්බන්ධතාවයන් වූ ඉඩම් හිමියන්ගේ ඉඩම් සහ ගොවීන් පීඩාවට පත් කිරීම වැනි, එක් පැත්තකින් විද්‍යාමාන වූ ධනේශ්වර සම්බන්ධතාවයන් නීති ගත කළ අතර, අධිරාජ්‍යවාදීන් විසින් චීන ජාතිය සම්පූර්ණයෙන්ම පාලනය කරන තෙක් පසුගාමී දේශපාලන ආයතන සහ අදහස් බලයත් සමග දිගටම ගෙන ගියේය.

පීඩිත ජාතීන්ගේ සහ චීනයේ විප්ලවය, අදියර දෙකක ක්‍රියාවලියක් ලෙස මාඕ තේරුම් ගත්තේය. පළමු අදියර නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයයි. අධිරාජ්‍ය වාදීන්ට සේවය කරන පරාධීන රාජ්‍යය ක්‍රමය, නිළධාරිවාදී ධනපති පංතිය, අර්ධ රදළ සහ රදළ ක්‍රමය මුලින් උපුටා දමන්ට, අධිරාජ්‍ය වාදයට පහරදීමට හැකි සියල්ලෝම මෙම විප්ලවය මගින් එක්සත් කරයි. ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ පළමු අදියරේදී, ''වගා කරන්නාට ඉඩම්'' යන සංකල්පය මත ඉඩම් ප්‍රතිසංස්කරණ සිදු කිරීම, මෙන්ම සුළු ජාතික හා කාන්තා පීඩනය හමාර කිරීම වැනි වැදගත් ප්‍රජාතන්ත්‍රීය කාර්යයන් සිදු කිරීමට තිබුණි. ධනේශ්වර ප්‍රජාතන්ත්‍ර විප්ලවය හා සම්බන්ධ පෙත් මෙම ඉල්ලීම් ඉදිරිපත් කරන අතර ධනවාදී සංවර්ධනයට දෙර විවර කරන්ට සහ දියුණු කරන්ට හැකියාව ලැබෙනු ඇත. ගොවි ජනතාව

සමග එක්සත් වුණු නිර්ධන පංතිය විසින් නායකත්වය දෙනු ලබන විප්ලවීය දේශපාලන බලයෙන් සකස් වුණු විප්ලවයක් මගින් විශේෂයෙන් නව රාජ්‍යය ඇරඹෙන බවත්, මේ අරගලය ලෝක විප්ලවයේ කොටසක් වශයෙන් ගෙන යාමටත්, සමාජ වාදය කරා ඉක්මනින් ගෙන යාමේ වැඩ පිළිවෙල සහ දර්ශනයෙන් සන්නද්ධව, සිදු කරනු ලබන එවැනි විප්ලවයක වැඩ පිළිවෙලක් මගින් සමාජ වාදයේ සිට කොමියුනිස්ට් වාදයට පරිවර්තනය වීමට දෙර විවර කරන බවටත් මාඕ තර්ක කළේය.

ආරම්භයේදීම පැහැදිලි දුර දර්ශී, සමාජවාදී හා කොමියුනිස්ට් උපායෙන් යුත් නිර්ධන පංතියක් මගින් සකල විප්ලවීය ක්‍රියාවලියටම නායකත්වය දිය යුතු බව, චීන කොමියුනිස්ට් පක්ෂයේ සමහරුන්ගේ විරෝධයන් මැද මාඕ ස්ථිර ලෙසම තරයේ ප්‍රකාශ කර සිටියේය. විප්ලවය උත්කර්ෂවත් අවධියකට ගමන් කරවීමට, කොමියුනිස්ට් ලෝකයක අරමුණ ඇති නිර්ධන පංතික දේශපාලන හා දෘෂ්ඨිමය නියාමකත්වයෙන් යුත් සකල දෙස්හිම පැතිර ගිය රතු හුයක් මෙන් නායකත්වයක් ඊට තිබිය යුතුය.

## යුද්ධය සහ ජයග්‍රහණය

දිගු පා ගමනින් පසුව මාඕ සහ ඔහුගේ භට කණ්ඩායම් ජපාන ආක්‍රමණිකයන් පලවා හැරීම පමණක් නොව කුවෝමින්තානයද පරාජය කර මුළු රට පුරාම බලය අල්ලා ගැනීමේ ඉලක්කය ඇතිව පක්ෂය සහ රතු හමුදාව, නැවත ගොඩ නැගූ යේනානයෙහි පදිංචි විය.

ජීවිතයේ සියළුම පැති වටා විප්ලවීය කණ්ඩායම් ඉදිකොට තිබුණු සහ නව සමාජවාදී සමාජයේ බීජ පැළ කර තිබුණු යේනානයට බුද්ධිමතුන්, කම්කරුවන්, ගොවීන් දහස් ගණනින් ආවෝය. වැඩිහිටි ජනතාවගේ, පාසැල් සිසුන්ගේ, කම්කරුවන්ගේ, ගොවීන්ගේ, තරුණයින්ගේ, සහ කාන්තාවන්ගේ සම්මේලන එහි තිබුණි. නව සමාජයේ නිෂ්පාදන සාමාජිකයන් වන ආකාරය ගැන සාකච්ඡා කරන්ට මුණ ගැසුණු ''රස්තියාදු කාරයින්ගේ'' සම්මේලනයක් පවා එහි තිබුණි.

රදළවාදයේ දිළිඳුකම සහ කෲරත්වය මුලින් උපුටා දමන්ට බහු ජනතාව පොළඹවා තිබුණි. යෝජිත විවාහ ක්‍රමය, අබිං බීම, ළදරුවන් මරා දැමීම, වහල් වෙළඳම සහ ගණිකා වෘත්තිය පිස දමා තිබුණි. ආගම සහ මිත්‍යා ඇදහීම් වලට විද්‍යාත්මක සහ විප්ලවීය දැනුම ස්ථාපිත කරන්ට පටන් ගත්තේය. කෲර ඉඩම් හිමියන්ට ජනතාව, සූරා කෑමට තවදුරටත් ඉඩ නොතිබුණි. (1945 ජපානය පරාජය කළ පසු නැවත වරක් සිවිල් යුද්ධයත් සමග ඉඩම් වැඩ කළ ගොවීන්ට ඉඩම් පුළුල්ව බෙදා දුන්නේය.)

විශාල නගර වලින් පැමිණි බුද්ධිමතුන්, කලාකරුවන් 1933 දී පක්ෂයට එකතු වුණු චියැං චිං සමග 1937 දී යේනානයට පැමිණියහ. යේනානයෙහි පිහිටුවා තිබුණු කලා ඇකඩමියේ නාට්‍ය කලාව හැදෑරූ චියැං චිං ප්‍රචාරක කණ්ඩායමට එකතුවී ගොවි ජනතාව සඳහා නාට්‍ය රඟ දැක්වීමට ගම්බද පෙදෙස් වලට ගියාය.

සමාජයේ මහ ජනයා පිළිබඳව සම්පූර්ණ සංස්කෘතික ක්‍රියාවන් තේරුම්ගත් චිත්‍ර, කවි සහ ලිවීමේ වේගවත් කලාවක් මාඕට තිබුණි. ඇකඩමියේදී නැටුම්, විවිධ ප්‍රසංග සහ නාට්‍යවලටද ඔහු ඉදිරිපත් විය. ඔහු චියැං චිං හමුවී ආදරයෙන් වෙළුණු අතර ඔවුන් දෙදෙනා 1939 දී විවාහ විය.

එඩ්ගා(ර්) ස්නෝව් (Edgar Snow) සහ ඇනා ලූවිස් ස්ට්‍රෝන්ග් (Anna Louise Strong) වැනි බටහිර ජන මාධ්‍යවේදීන් ජනතාව සමඟ මාඕගේ සම්බන්ධතාවයන් කිඳ බැස තිබුණු ඔහුගේ ශක්තිය සහ ඔහුගේ උසස් දර්ශනික අදහස් තිබුණු යේනානයට ගොස් තිබුණි. එක් ඉතිහාසඥයෙක් ඔහු ගැන මෙසේ ලියූවේය: ''අණ්ඩ දැමූ කලිසම්, ගෙවී ගිය පිම්බුණු ජැකට්, පත්‍ර සහ පොත් වලින් පිරී ගිය සාක්කු තිබුණු මාඕගේ ඡායාරූප සෑම තැනම තිබුණි. ඔහු සමග ඔහුගේ දිග සම්මුඛ සාකච්ඡාවල, අතීතය සිහි ගන්වන බොහෝ දේ තිබුණි. සියලුම රාත්‍රීන්හි අවසානයේ අවසාන විස්තරය පහද දීම සඳහා වෙහෙස නොබලා ක්‍රියා කිරීමට මාඕ මහත් ලැදිකමක් දැක්වීය. නෘත්‍ය දැක්වීමට මෙන්ම විනෝද වීමටද ඔහු එකතුවී තිබුණි. ඡායාරූපවල පින්තූරයේ මැද අල්ලා ගන්ට උත්සාහ කිරීමේ පුරුද්දක් ඔහුට නොතිබුණි. ඇනා ලූවී ස්ට්‍රෝන්ග්, ඔහුගේම තාලයකට නටන මාඕගේ ඡායාරූපයට මනහර වචනයක් දෙමින් අපෙන් ඉවත්ව ගියාය. ඔහු හොඳ නැටුම් කාරයෙක් නොවීය. ගුහාවේ පිටත ළමයි දුවන අතර ඔහු වැඩ කළේය. මාඕ පිළිබඳව සුරතල් කරුණාවන්ත දඟකාර කමක් එහි තිබුණි. නමුත් එය සැණෙකින් බරපතලව වෙනස් විය හැක. කථා කිරීමේදී අධ්‍යාපනය නොලද කෙනෙකුට පවා වඩාත් අමාරු විෂයක් වුවද වටහා ගැනීමට පුලුවන් ආකාරයට ඉදිරිපත් කිරීමේ විධියක් ඔහුට තිබුණි. ඔහුගේ ශ්‍රාවක පිරිසේ හිස්වලට ඉහලින් ඔහු කථා කළේ නැත. ඔහු කවදාවත් ඊට පහලින් කථා කළේත් නැත. ජනතාව සහ ඔහු අතර ඉතා කිට්ටු සුහදත්වයක් තිබුණි. ඔහු නිතරම දැන හඳුණා ගැනීමට කැමතිය''. (හැන් සුයිගේ (Han Suyin) උදෑසන විප්ලවය)

යේනානය චීනය පුරා නිදහස් ප්‍රදේශ ව්‍යාප්ත කරන සහ හමායන විප්ලවීය ව්‍යාපාරයක කේන්ද්‍රස්තානය විය. 1945 දී පළාත් නවයක රතු මූල කඳවුරු 19 ක් තිබුණි. දශ ලක්ෂ සියයක ජන ගහණයක් කොමියුනිස්ට් පාලනය යටතේ පැවතුණි.

1945 දී ජපන් ආක්‍රමණිකයන් ව අවසාන වශයෙන් පරාජය කළේය. කොමියුනිස්ට්වාදීන් ජපානයට විරුද්ධව සටන් කරද්දී කොමියුනිස්ට්වාදීන්ට පහර නොදුන් එක්සත් ජනපදය ඒ මොහොතේදී ඇගේ උපායන් වහාම වෙනස් කළාය. කොමියුනිස්ට්වාදීන් පරාජය කිරීමට කූවෝමින්තානයට කළ හැකි සෑම උදවුවක්ම කළාය. කූවෝමින්තානයට ප්‍රධාන නගර සහ වරායවල ආරක්ෂාවට, ගුවන් තොටු පළවල් ආරක්ෂා කරන්ට, පණිවුඩ හුවමාරු මධ්‍යස්තාන, ගල් අඟුරු ආකර සහ දුම්රිය මාර්ග අත්පත් කරගන්ට 90,000 ක නාවික භට පිරිසක් පිටත් කළහ. ඇමෙරිකන් උපදේශකයෝ කූවෝමින්තාන් නිළධාරීන් පුහුණු කළ අතර, එක්සත් ජනපදය චියැං ට නවීන ආයුධ සහ උපකරණ දුන්නේය. ඊළඟ අවුරුදු දෙක තුළ එක්සත් ජනපදය ණය සහ උපකරණ වශයෙන් ඩොලර් බිලියන 1.5 ක් චියැං ට ලබා දී ඇත. (අදට සලකා බැලුවහොත් ඩොලර් බිලියන 13 කි.) නමුත් ජනතාවගේ විමුක්ති හමුදව 1945 පළමු භාගයේදී ලක්ෂ 3 කට ආසන්න කූවෝමින්තාන් හමුදව

පරාජය කර ජය ලැබීය. චියැං කායි ෂෙක් රජය 1949 අප්‍රියෙල් වලදී බිඳ වැටුණි. මහජන විමුක්ති හමුදාව ඊළඟ මාස කිහිපය තුල ප්‍රධාන නගර අත්පත් කර ගත්තේය.

## නව සමාජවාදී චීනය

1949 ඔක්තෝබර් 01 වන දින චීන මහ ජන සමූහාණ්ඩුව පිහිටුවීම දැනුම් දීමට බීජිං ප්‍රධාන නගරයේ තියාන්මෙන් චතුරස්‍රයේදී, මාඕ නැඟී සිටියේය. ''චීන ජනතාව නැඟී සිට ඇත'' මාඕ දශ ලක්ෂ ගණනකට කථාකර ප්‍රකාශ කළේය.

විදේශීය අධිරාජ්‍යවාදීන් පළවා හරින්ටත්, ඔවුන්ගේ පීඩකයන් පෙරලා දමන්ටත්, 20 වසරක සන්නද්ධ අරගලයට, මාඕ චීන ජනතාවට නායකත්වය දී ඇත. සියලුම පීඩක අදහස්, සහ සම්බන්ධතාවයන්, සහ පංති වලින් නිදහස් කොමියුනිස්ට් ලෝකයක් ඉදි කිරීමේ අරමුණ ඇතිව පරිවර්තනීය සමාජයක් වශයෙන් පංති සමාජය සමඟ ඉදිරියට යාමට, සමාජවාදය ගොඩ නැගීමට ජනතාවට දැන් බලය හිමිවී ඇත.

මේ ඓතිහාසික දිනය සැමරීමේදී මාඕ ද ජනතාව සමග ප්‍රීතිය බෙදා හදා ගති. නමුත් ඔහු මේ කාරණය වටහා ගති; ''චීන විප්ලවය ශ්‍රේෂ්ඨය, නමුත් විප්ලවයෙන් පසුව ගමන් කිරීමට තිබෙන දුර බොහෝය, මහත් දුෂ්කර කාර්යයන් සිදු කිරීමට ඇත.''

## 2 කොටස

## අලුත් සමාජවාදී චීනයක්

විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල චීන බහු ජනතාවට කෙලවරක් නැති දරිද්‍රතාවයෙන් සහ කුසගින්නෙන්, කෲර ඉඩම් හිමියන්ගෙන්, ජීවිතයේ සෑම අවස්ථාවකම කාන්තාවන් අවමානයට සහ පීඩාවට පත් වීමෙන්, මතට ඇබ්බැහිවීම මගින්, අධ්‍යාපනය මඳ කමින් සහ සෞඛ්‍ය පහසුකම් රහිත බව වැනි බොහෝ භයානක දේවලින් පීඩා විඳින්නට සිදුව තිබුණි. මේ තත්ත්වය වෙනස් කරන්නට චීන බහු ජනතාවට කිසිම ඉඩක් තිබී නැත. මේ සියල්ලම බලයෙන් කරවන ලද අතර පීඩක ආර්ථිකයේ සහ සමාජ ක්‍රමයේ මෙන්ම පාලක පංතියේ අනුග්‍රහය ඊට ලැබී ඇත.

අලුත් සමාජවාදී චීනය පැරැණි සමාජයෙන් සියලුම කැලැල් උදුරා කරගෙන ඇත. නමුත් දැන් රාජ්‍ය බලය බහු ජනතාවගේ අත්වලය. පැරණි පීඩක සමාජයේ ඉතිරි වූ කොටස් මකා දමන්ට දැන් ජනතාවගේ උත්සාහයන්ට පක්ෂය සහ රාජ්‍ය අවයව මගින් අනුබලය දෙනු ඇත. දැන් සම්පූර්ණයෙන් වෙනස් වූ ජනතාවට වෙනස් ආකාරයට ප්‍රශ්නයන්ට ප්‍රවේශ වීමට සිදුවනු ඇත.

නව රජය විදේශීය අධිරාජ්‍යවාදීන්ට සහ විශාල චීන ධනපතියන්ට අයිතිව තිබූ ව්‍යාපාර පවරා ගැනීමට සහ රාජ්‍ය සන්තක කිරීමට වහාම නීති පැනෙව්වේය.

විශාල ඉඩම් හිමියන් සතුව තිබූ දේපළ ගොවි ජනතාව අතර බෙදා දුන්නේය.

දික්කසාද වීමේ අයිතිය මිනිසුන්ට මෙන්ම කාන්තාවන්ටත් දෙමින් යෝජිත විවාහ නීති විරෝධී කර නව නීති පැනවීය. දුප්පත්කම නිසා පොදු කාරණයක්ව තිබුණු දරුවන් විකිණීම සහ ළමා ශ්‍රමය, තහනම් කරන ලදි. පැය 12-16 දක්වා තිබූ වැඩ දිනය පැය 8 දක්වා අඩු කරන ලදි.

ඉක්මනින් කරන ලද බොහෝ දේවල්, විස්මය ජනක ලෙස ජනතාවගේ ජීවිත වඩා යහපත් කළේය. ඒ සැණින්ම සමාජ ප්‍රශ්න විසඳීමේ සම්පූර්ණ ක්‍රියා මාර්ගයක් තුළට ඒවා යොමු කළේය. උදාහරණ වශයෙන් මත් ද්‍රව්‍ය, සූදු කෙළිම, ගණිකා වෘත්තිය විශාල ප්‍රශ්නයක්ව තිබුණි. පැරැණි ප්‍රතිගාමී ආණ්ඩුවේ රහස් පොලිසිය සමග සම්බන්ධකම් පැවැත්වූ බොහෝ ලොකු තක්කඩියන්, වෛශ්‍යා ස්ත්‍රීන් සපයන්නන්, අබිං විකුණන්නන් අත් අඩංගුවට ගැනුණි. ඒ අතර අබිං වලට ඇබ්බැහිවූවන්ට, පෙර වෛශ්‍යා ස්ත්‍රීන්ට සහ සුළු අපරාධ කරුවන්ට; රැකියා, සෞඛ්‍ය පහසුකම්, නිවාස, අධ්‍යාපනය ලබාදී සමාජය නැවත සකස් කිරීමේ සම්පූර්ණ වැඩ පිළිවෙලට දායක වෙන්ට අවස්ථාව ලබා දුණි.

ගොවීන් දශ ලක්ෂ ගණන් සම්මේලනවලට, කම්කරුවන් වෘත්තීය සමිතිවලට, කාන්තා සංවිධානවලට, තරුණ කණ්ඩායම්වලට, සංස්කෘතික, විද්‍යාත්මක, අධ්‍යාපනික සහ අනික් වෘත්තීය බුද්ධිමතුන්ගේ සංගම්වලට එකතුවී, ජනතාවගේ සමාජ සහ දේශපාලන ජීවිත පරිවර්තනය විය. සමාජයේ විවිධ ක්ෂේත්‍රයන්ට හැරවීමට වැදගත් තීරණ ගැනීමට සහ ඇති කරන ආකාරයක් එවැනි බහු ජන සංවිධාන ජනතාවට ලබා දුන්ණේය. නගරවල උදාහරණ සඳහා ''නාගරික නිවාස කොමිටි'' පවුල් සිය ගණනක් වෙනුවෙන් ඉදිරිපත් වෙමින් අසල් වැසි ආරවුල් සහ පවුල් නිරවුල් කරන්ට සුළු අපරාධ කටයුතු විසඳන්ට උදවු කළේය. පොදු සෞඛ්‍ය ආරක්ෂාව, ගිනි නිවීම, පවුල්වල අවශ්‍යතා සහ අසල්වැසියන්ට සංස්කෘතික සහ විනෝදාත්මක වැඩ සටහන් ඉදිරිපත් කළේය. දුප්පත් අසල් වැසියන් අතර සහ කර්මාන්ත ශාලාවල, ගම්වල, බහු ජන සාහිත්‍ය ව්‍යාපාර සංවිධානය කරනු ලැබිණි.

දුප්පත් සහ ඉඩම් අහිමි ගොවීන් මත පදනම් වූ ගොවි සංගම් වලට ඉඩම් ප්‍රතිසංස්කරණ ඉටු කරන්ට වගකීම් දී තිබුණි. සමාජ වෙනස් වීම මෙන්ම මෙය මූලික ආර්ථික වෙනසක් විය. උදාහරණයක් ලෙස පළමු වතාවට කාන්තාවන් සඳහා ද ඉඩම් ලැබුණි. 1952 වන විට චීනයේ වගා කළ හැකි ඉඩම් වලින් භාගයකට වැඩියෙන් නැවත බෙදා දී තිබුණි. දුප්පත් සහ ඉඩම් රහිත දශ ලක්ෂ තුන්සියයක් ගොවීන්ට ඉඩම් ලබාදී තිබුණි.

## සමාජවාදී ආර්ථිකය, කඩා බිඳ ගෙන යෑම

විප්ලවය බලයට පත්වූ සැනෙකින් සමාජය වෙනස් කරන්නේ කොහොමද යන ප්‍රශ්නයට මුහුණ දුනි. සමහර පක්ෂ නායකයෝ රදළ ඉඩම් හිමියන්ට විරුද්ධව විප්ලවය තුළ මාඕ සමග ගමන් කළ ද, ධනවාදී බැඳීම සහ අධිරාජ්‍ය වාදයට ඇති ලැදිකම හා විදේශීය බලපෑම නිසා, සීමා රහිත ලෙස ධනවාදයට අනුබල

දීමට බලකර තිබුණි. බර කර්මාන්ත සංවර්ධනය කරන තුරු කෘෂි කර්මය ඉදිරියට ගත නොහැකි බව ඔවුහු කියා තිබුණි. ගම්බද ප්‍රදේශවල පුද්ගලිකව ගොවිතැන් කිරීම ආරක්‍ෂා කරමින් සහ විදේශීය ණය සහ විදේශීය තාක්‍ෂණය මත විශ්වාසය තබමින් ඔවුහු තර්ක කර තිබුණි. ඔවුහු ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ, සමාජවාදී ආර්ථිකය සංවර්ධනය කිරීම පිළිබඳ ප්‍රමුඛ දෘෂ්ඨිය වූ, ''විශේෂයෙන්ම මුලින් පරාධීන සහ පසුගාමී රටවල, ආරම්භයේදී විශාල කර්මාන්ත ශාලා, බර යන්ත්‍ර සූත්‍ර, නව තාක්‍ෂණය යනාදී නවීන නිෂ්පාදන බලවේග ඉදි කළ විට පමණක් ජනතාව අතර සම්බන්ධතාවයන් පරිවර්තනය කළ හැකිය'' යන්න ඔස්සේ ගියහ.

''අයිතියේ සහ බෙදා හැරීමේ ආකාරයන් විප්ලවීයකරණය කිරීම සහ ද්‍රව්‍ය නිෂ්පාදනයට ජනතාව සෑම ආකාරයකින්ම එකිනෙකා සමග වැඩ කිරීමට යොමු වීමෙන්, වඩා උසස් නිෂ්පාදන බලවේගයන් හි සංවර්ධනය ඉක්මන් කළ හැකිය'', මාඕ තර්ක කළේය. සාමූහික ආකාරයෙන් එකට වැඩ කිරීමට පොළඹවන්න වෑයම් කරමින්, ඉඩම් නැවත බෙදා දීම ඇරඹීම මගින්, ජනතාව අතර විප්ලවීය පරිවර්තනයන් සහ වෙනස්කම් ඉදිරියට ගෙන යා යුතුය, එමෙන්ම ශත වර්ෂ ගණනාවක් පැවැති රදළවාදයේ පසුගාමී අදහස් කඩා බිඳ දමමින්, විද්‍යාත්මකව ගොවිතැන් කිරීමේ තාක්‍ෂණය, නව ගොවි බිම් විවෘත කිරීම, සහ ජල පාලනය සංවර්ධනය කිරීම වැනි දේවල් වලට උනන්දු කළ යුතුය.

සම්පූර්ණ සමාජ ක්‍රියාවලියම වෙනස් කිරීමට ඉතා වැදගත් වූ ජනතා චින්තනය විප්ලවීයකරණය කරන්නේ කෙලෙසද යන්න, මාඕ, අවබෝධ කරගත් හා සංවර්ධනය කළ අයුරු පිළිබඳව උදාහරණයකි මෙය.

ජනතාව අතර සමාජ හා ආර්ථික සම්බන්ධතාවයන් සංවර්ධනය කිරීමට පෙර නවීන කර්මාන්ත සංවර්ධනය කිරීම නිසා විශාල අසමානතාවයකට මග පෙන්වනු ලැබිණි, මක්නිසාදයත් කර්මාන්ත ශාලා සංවර්ධනයට යොමු වීම දැනටමත් උසස් දියුණුවක් ලෙස අදහස් කරන්නේද?, වෙනත් වචනයකින් කියතොත් විශාල නගරවල පමණක් ඒවා කිහිපයක් තිබේ. මෙය නගරය සහ ගම අතර, දුප්පත් සහ වඩා හොඳ ප්‍රදේශ අතර වෙනස්කම් සහ අසමානතාවයන් සීමා කිරීම වෙනුවට වඩාත් පුළුල් වී ඇත. මාඕගේ තර්කයට අනුව, විශ්ඥාතභාවයේ පිම් සහ නිෂ්පාදනයේ පිම් අතර සීඝ්‍රගාමී දියුණුවට, ''විප්ලවය අල්ලා ගන්න. නිෂ්පාදනය දියුණු කරන්න'' යන ඔහුගේ ප්‍රසිද්ධ සටන් පාඨය පසුව ඔහු කේන්ද්‍රගත කළේය. මෙම මූලික ප්‍රකාශනයට ප්‍රවේශ වීමට ගත් ක්‍රියා මාර්ගය උඩ එම කාලයේ පක්‍ෂය තුළ අරගලය දිනන්නට මාඕට හැකි විය.

## මාඕගේ නායකත්වය

මාඕ මේ ප්‍රශ්න විසඳීමේ දී ක්‍රියා කළ ආකාරයෙන් ඔහු නායකත්වය දුන් අයුරු සහ ඔහු කැමතිව සිටිය දෙයෙහි පින්තූරයක් ලබා දෙයි. නව සමාජවාදී ආර්ථිකයක් ගොඩ නැගීමට මේ මාවත කඩා බිඳ ගෙන යෑමට ඒ කාලය වන තෙක් සෝවියට් සංගමයේ සමාජවාදය ගොඩ නැගීමේ ධනාත්මක සහ නිෂේධාත්මක අත්දැකීම් සම්පූර්ණයෙන් අධ්‍යයනය කරමින් සහ නැවත සකස් කරමින්; ජනතාව සමග විමර්ශණයේ සහ ගැඹුරු සාකච්ඡාවේ යෙදෙමින්; චීනයේ තත්ත්වය සකස්



මාඕ ගම්බද ප්‍රදේශයක දී.

කිරීමට කොමියුනිස්ට් මූල ධර්ම සහ ක්‍රියාමාර්ගයන් යොදවමින්; ඉදිරියට යෑම සඳහා නව සම්මතයන් අවබෝධ කර ගනිමින්, පදනම දැමීමට ඉදිරියට පැමිණියහ.

තව දුරටත් ගෙන යමින් තිබෙන දෙය පිළිබඳව කෙලින්ම ලැබෙන තොරතුරු සොයා බැලීමට, ගොවියන් සමග කථා කරමින් 1951 දී මාඕ ගම්බද සංචාරය කළේය. විප්ලවය විශාල ඉඩම් හිමියන්ට අයත්ව තිබූ ඉඩම් අහිමි කර ඉඩම් නැති හෝ ඉඩම් සුළු වශයෙන් තිබුණු දිළිඳුම ගොවියන්ට බෙදා දී තිබුණි. හුදෙක් සාමූහික ලෙස වැඩ කිරීමෙන් පමණක් නිෂ්පාදනය වැඩි කළ හැක, නමුත් ජනතාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කළ හැක්කේ විප්ලවීය පරිවර්තනයක් මගින් පමණි.

ගොවීහු ඔවුන්ගේ සතුන් සහ මෙවලම් හුවමාරු කර ගනිමින්, පෞද්ගලික ඉඩම් කැබලි වැඩ කරන්ට එකිනෙකාට උදවු කරන අන්‍යෝන්‍ය ආධාර කණ්ඩායම් සාද තිබුණි. 1952 වන විට ගොවීන්ගෙන් සියයට හතලිහකටත් වඩා එවැනි කණ්ඩායම් වල සිටියෝය. නමුත් මේවාට තවමත් ගං වතුර හෝ දැඩි නියගය සමග හැප්පෙන්නට විශාල හැකියාවක් නොතිබුණි. ඔවුන් සතුව ප්‍රධාන තාක්ෂණික යෙදීම් ක්‍රියාත්මකව නොතිබුණු අතර බොහෝ දේවල් ධනවත් ගොවීන්ගේ බලපෑම යටතේ තිබුණි.

ගොවීන් නිෂ්පාදනය විප්ලවීය කරන්ට අත්හදා බලමින්, නිර්මාණාත්මක මාර්ගයන්ගෙන් ඉදිරියට එමින් සිටියහ. ''පළමුව මා ගැන සිතන්න'' වෙනුවට ''ජනතාවට සේවය කරන්න'' යන ආකල්පය ආදේශ කරමින්, කාන්තාව පහලට ඇද දමන පසුගාමී කොන්ෆියුසියස් අදහස් වැනි ජනතාව අතර තිබූ අදහස්වල සැබෑ පරිවර්තනයක් සහ විප්ලවයක් සිදු විය.

ඔවුන්ගේම අයිතියෙන් සමහර ගොවීන් විශාල සමූපකාර ඇති කිරීම ආරම්භ කළේය. මාඕ මෙය මුවහත් කර එයට අනුබල දී මෙයට මග පෙන්වන්නට, උදවු කරන්නට, මහජන විමුක්ති හමුදාවේ සොල්දාදුවන් පොළඹවන්නට පක්ෂයට නායකත්වය දුන්නේය. 1956 මැද දී ගොවි පවුල් වලින් සියයට 90 ක්ම එවැනි සමූපකාරවලට අයත්විය.

නව සමාජවාදී සමාජය සංවර්ධනය කිරීමේ සන්දර්භය තුළ පංති අරගලය ගෙන යාමට මාඕ නායකත්වය ලබා දුනි. කොමියුනිස්ට් නායකත්වයේ කාර්ය භාරය හා සමාජවාදය යටතේ ජනතාවගේ උත්පාදක ජවය වඩා සීඝ්‍රගාමී විය.

# මහා ඉදිරි පිම්ම (Great Leap Forward)

සමාජවාදයේ මාඕගේ දැක්ම ජනතාවට; ආහාර, ඇඳුම් සහ මූලික අයිතිවාසිකම් ලබාදීම ඉක්මවා ගියේය. පැරැණි පීඩක ආර්ථික සහ සමාජ සම්බන්ධතාවයන් ඉවත් කර දමන විප්ලවයක් ඔහු ඉලක්ක කළේය. පීඩක සම්බන්ධතාවයන්හි ගමන් මාර්ගය ආරක්ෂා කරන සහ සැඟවී තිබෙන හරයන්ට සහ පසුගාමී අදහස් වලට, අභියෝග කරන විප්ලවයක් විය යුතුය. ජනතාවගේ සිතුම් පැතුම් සහ ක්‍රියාකාරීත්වයේ විප්ලවයකි.

මෙම අභිමතාර්ථයන් අරමුණුකොට ගත්, සමාජවාදී ආර්ථිකය සංවර්ධනය සඳහා නිර්භීත අලුත් සැලැස්ම වූ **ශ්‍රේෂ්ඨ මහා ඉදිරි පිම්ම (Great Leap Forward)**, 1958 දී මාඕ දියත් කළේය. ගම්බද ජනතාව විශාල වශයෙන් ගොවි කොමියුනවලට එක් කොට ඔවුන් ව ආර්ථික, සමාජ, සංස්කෘතික, ආරක්ෂක සහ පරිපාලන කටයුතු වලට සම්බන්ධ කළහ.

මහා ඉදිරි පිම්ම මෝඩ කාල්පනික අත්හදා බැලීමක් ලෙස අද ඊට අපවාද කර ඇත. නමුත් සත්‍යය ආර්ථික සහ සමාජ සම්බන්ධතාවයන් වඩාත් නිදහස් කරමින් සංවර්ධනය කිරීමේ සැබෑ ප්‍රතිපත්තිය මෙය විය.

15,000 සිට 25,000 දක්වා ජනතාව සම්බන්ධවූ කොමියුන මගින් ඒවාට හැකි අයුරින් විශාල ගං වතුර පාලනය කිරීමට, වන වගා ව්‍යාපෘති සහ මහා මාර්ග හා බල ශක්ති යන්ත්‍රෝපකරණ තැනීමට, උසස් පාසැල් ඉදි කිරීමට ක්‍රියා කළහ. ඉහළ අස්වැන්න සහිත තිරිඟු, වී සහ අනිකුත් බෝග වර්ගවල නව ප්‍රබේද අභිජනනය කරන්නට පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටු විය. කඳු ප්‍රදේශවල හෙල් මළු සකස් කරමින් නව ගොවි බිම් ඉදි විය.

කොමියුන අලුත් සහ නිදහස් දේශපාලන, සමාජ සහ සංස්කෘතික ජීවිතයක් සැපයීය. සමාජ අවශ්‍යතාවයන්ට සාමූහික විසඳුම් සොයා ගනිමින්, එක් එක් පවුලකට ජීවිකාව කරගෙන යාමට අවසර දෙනවා වෙනුවට, අලුත් සමාජයක් නිර්මාණය කිරීමේ පොදු කාරණය තුළ කාන්තාවන් වඩාත්, සම්පූර්ණයෙන්ම සහභාගි කරවා ගැනීමට හැකිදේ එය කළේය. කොමියුන සාමූහික නිවාස අලුත් වැඩියාව, සමූහ ආහාර ශාලා, ළදරු ආයතන, සහ නවක නාට්‍ය කණ්ඩායම් සංවිධානය කළේය.

මේ විශාල ආර්ථික සහ සමාජ පරිවර්තන හේතුවෙන්, පරණ පුරුදු සහ ඒවායේ හරයන් ද, අන්ධ විශ්වාසයන් ද රදළ සිරිත් ද අභියෝගයට ලක් විය. කම්කරුවන් සහ ගොවීන් අතර ද, ගම සහ නගරය අතර ද පරතරය අඩු කළේය.

මහා ඉදිරි පිම්ම මහත් විපතක් වුණු බවත්, මාඕගේ දේශපාලනය නිසා ජනතාව හාමතේ සිටිය බවත්, කොමියුනවල සැබෑවටම වහල් ශ්‍රමය තිබුණ බවත් ජනතාවට අද ඇසෙති. නමුත් මෙය බොරුවකි.

මේ කාලයේ දුර්භික්ෂයක් තිබුණි. බොහෝ දෙනා මිය ගියේය. නමුත් මේ අවුරුදුවල දුෂ්කරතාවයන් සංකීර්ණ ලෙස පෙනෙන්නට තිබුණි. ගං වතුර සහ දැඩි

නියඟයෙන් අතිශය පීඩාකාරී කාලගුණ තත්ත්වයෙන් 1959 දී චීනය පීඩා වින්දේය. (මෙය චීනයට ශත වර්ෂයේ නරකම කාලයයි) මෙය අතිශයින්ම ආහාර නිෂ්පාදනයත් සමග ගැටුණි. 1950 මැද දී ධනවාදය ගොඩ නැගී තිබුණු සෝවියට් සංගමය චීනයට ලබා දෙන ආධාර නවතා දමා කාර්මික උපදේශකයින් ඉවත් කර ගත්තේය.

නායකත්වය අතින් වැරැදි සිදු විය. උදහරණ වශයෙන් ආහාර නිෂ්පාදනයට පාඩු සිදු වෙද්දී ගම්බද ප්‍රදේශවල කෘෂි කාර්මික නොවන ව්‍යාපෘති සඳහා බොහෝ කාලය මිඩංගු කළේය. ප්‍රාදේශීය නිළධාරීහු සත්‍ය ලෙසම තිබෙන ධාන්‍ය ප්‍රමාණය දැන ගන්ට අපහසු කරමින්, නිෂ්පාදනය වැඩි කර දැක්වූ වාර්තා ලබා දුණි. නමුත් මාඕ පක්ෂයේ විප්ලවීය නායකත්වය සමග නව දේශපාලන ප්‍රතිපත්ති වලින් මේ ප්‍රශ්න ප්‍රකාශ කරන්ට උත්සාහ කළේය. උදහරණ වශයෙන් බෙදා හරිනු ලබන ධාන්‍ය ප්‍රමාණය, රජය ඉතා අඩු කරන්ටත් සමහර කෘෂි කාර්මික නොවන ව්‍යාපෘති ක්‍රමානුකූලව වඩාත් ආහාර නිෂ්පාදනයට නවතා දැමීමට සහ ධාන්‍ය සීමා කර බෙදා දෙන්ටත්, අත්‍යවශ්‍ය ධාන්‍ය විපතට පත් ප්‍රදේශවලට යැවීමටත් කටයුතු කෙරුණි.

මුල් අවුල් වියවුල් සහ අසීරුකම් තිබියදීත් සමාජය තුළ සැබෑ වේගවත් පරිවර්තනයක් සහ කඩා බිඳ ගෙන යෑමක් සිදු කරීම ඓතිහාසික කරුණකි. නමුත් අවසානයේදී සැබෑ කඩා බිඳ ගෙන යාම අත්හදා බලන ලදි. එම වෙනස චාරිත්‍ර සහ සිරිත් වලට අභියෝග කරමින්, අලුත් ඒවා අත්හදා බලමින්, පරණ ආකාරයන් කඩා බිඳ දැමිණි. මෙය මහා ඉදිරි පිම්මේ තත්ත්වයයි. ඉතිහාසයේ ප්‍රථම වතාවට දශ ලක්ෂ 600 කට අවම ආහාර වේලක් සහ ආහාර, ආරක්ෂාව සැපයීමට හැකි වීම 1970 වන විට සැබෑ සත්‍යයි. මහා ඉදිරි පිම්ම කාලයේ ආර්ථිකය සමග සමාජමය සහ දේශපාලනිකව ඉෂ්ට කරන්ට සෑම දෙයක්ම තිබුණි.

## සමාජවාදයේ ස්වභාවය පිළිබඳ වඩාත් පැහැදිලිභාවයක් ලබා ගැනීම

1950 දශකයේ මැද භාගයේ සෝවියට් සංගමයේ සමාජවාදය සම්පූර්ණයෙන්ම ඉවත් කර දැමීම වඩාත් හොඳ ලෝකයක සිහිනය දුටු සෑම කෙනෙකුටම බේදජනක විය. මෙය අලුත් සමාජවාදී සමාජයක් ස්ථාපිත කළ පළමු ස්ථානය විය. සමාජ වාදයේ අත්දැකීම් ලබා ගැනීමේ මාර්ගය මෙන්ම බොහෝ ශ්‍රේෂ්ඨ දේවල් එය ඉෂ්ඨ කර තිබුණි. එම විප්ලවය පෙරලා දැමීම බව අදහස් කරනුයේ කුමක්ද? ධනවාදය නැවත ස්ථාපිත කිරීමද?

ධනාත්මක සිද්ධි වලින් ඉගෙන ගනිමින්, නමුත් කොමියුනිස්ට් ලෝකයක අභිමතාර්තයෙන් ඉවතට නායකත්වය දුන්, සවිගැන්වුණු සමාජ අසමානතාවයන් ආරක්ෂා කළ, භාවිතාවේ සහ සංකල්පයන්ගේ වැරදි හඳුනා ගනිමින්, සහ තියුණු ලෙස විවේචනය කරමින් සෝවියට් සමාජයේ අත්දැකීම් ගැන ගැඹුරු අධ්‍යයනයක් මාඕ පවරා ගති. එම කාරණයේදී සමාජවාදී චීනයේ අත්දැකීම් වෙත, මාඕ තීක්ෂණ බැල්මක් හෙළීය.

පැහැදිලිවම සමාජවාදය ගොඩ නැගීම, පැරණි පීඩක සමාජයේ සියළුම ''කැළැල්'' ඉවත් කර දැමීම සඳහා ක්‍රියා කළ, මින් පෙර සිදු නොවූ ක්‍රියාවලියක් වූයේය. සෑම විටම පැරණි සමාජය හා ආර්ථිකය පරිවර්තනය කිරීම, සමාජවාදය ගොඩ නැගීම ලෙස අදහස් කළද, ඒ දේවල් සිදු කරමින්ම, පැරැණි සහ පීඩක ආකාරයේ සිතිවිලි මේ සියල්ල සමග ඉදිරියට ගියේය.

නමුත් මීට වඩා දුර ගිය යම් දෙයක් වටහා ගැනීමට, මාඕ, ඒවා සමග පොර බදමින් සිටියේය. කොමියුනිස්ට්වාදය වෙතට යන සමාජවාදී පර්වර්තනයේ නිසග ලක්ෂණ ගැන නැවුම් සහ ගැඹුරු විග්‍රහයක් ලබා ගැනීමට ඔහු අරගල කරමින් සිටියහ. **මේ තත්ත්වය තුළ ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය පවා සැබෑවටම වටහා ගෙන නොතිබුණු, විප්ලවයේ ජයග්‍රහණය සමාජවාදී සංවර්ධනය අරඹන අතර, එය පංති අරගලය අවසන් කරන බව අදහස් නොකරන බව මාඕ වටහා ගති.** මාඕ පසුව ඉදිරිපත් කළ පරිදි;

**''සමාජවාදී සමාජය දිගු ඓතිහාසික කාල පරිච්ඡේදයක් තුළින් ගමන් කරයි. සමාජවාදී ඓතිහාසික කාල පරිච්ඡේදයේ දී පංති, පංති අරගලය, පංති ප්‍රති විරෝධයන් පවතී. සමාජවාදී මාවත සහ ධනවාදී මාවත අතර අරගලය පවතී. ධනවාදය නැවත ස්ථාපිත කිරීමේ අනතුර පවතී. මේ අරගලයේ දිග් ගැස්සුණු සහ සංකීර්ණ ස්වභාවය අපි හඳුනා ගත යුතු වෙමු''**

සෝවියට් සංගමයේ සමාජවාදය බිඳ හෙළීමට සංවිධානය වුණු සහ නායකත්වය දුන් **දක්ෂිණාංශය කොමියුනිස්ට් පක්ෂයේම ඉහළ තලයේ** සිටි මිනිස්සු බව මාඕ දැක්කේය. ඔහු ඔහුම වටා පරීක්ෂා කළේය. එම තත්ත්වයන්ගේ දෝංකාර ඔහු දිටීය. සෝවියට් සංගමයේ සිදු කලා සේම **ධනවාදය නැවත නගා සිටුවන්නට** උවමනා කළ, චීන කොමියුනිස්ට් පක්ෂයේ ඉහළ බලවේග තුළ සිටි නායකයන් ඔහු දිටීය.

මේ ප්‍රශ්නය සමග ගනුදෙනු කරන අයුරු, මාඕ නිදි නැතිව සොයා බැලීය. සෝවියට් සංගමය දෙස පරීක්ෂාවෙන් බැලීමෙන් එහි පක්ෂ නායකයන් එම ප්‍රශ්නය විසඳ නොමැති බව ඔහු දැක්කේය. ස්ථිරව පුද්ගලිකවම ඉදිරි ගමනක් ඇති කරන්නේ නැති විට, යම්තාක් හෝ මතුපිටට යටින් පවත්නා ප්‍රශ්නය නිවැරදිව හඳුනා නොගෙන ඊට එරෙහිව අරගල කරන්නේ නැතිව, අනෙක් අය එකම මාර්ගයක් නියෝජනය කරමින් ඉදිරියට යමින් සිටියහ. විප්ලවීය මාවත පසු පසට ඇද දමන්ට උත්සාහ කරන ධනවාදී මග ගත් පක්ෂ නායකයින්ව විවේචනය කරන්ට, සමාජවාදී මාවත හා ධනවාදී මාවත අතර ඇති වෙනස ඇඳ දක්වන්ට, ඉතා ගැඹුරු ලෙස සහ සවිඥානිකව සමාජයේ සෑම දිශාවකින්ම අරගලය ඔසවා තබන්ට, පුළුල් බහු ජනතාව පුහුණු කිරීමට ක්‍රමයක් මාඕ සොයා බැලූහ. ජනතාව තුළ තිබූ ප්‍රශ්න කිරීමේ සහ කැරලි ගැසීමේ ආත්මය මුදවා හරින්ට ඔහු බොහෝ දෑ උත්සාහ කර බලා තිබුණි. නමුත් ඔහු පසුව සමාලෝචනය කළ පරිදි, මේ දක්වා ජනතාව පුහුණු කරවන්ට ඔහු සහ විප්ලවීය නායකත්වය තවම ක්‍රමයක් සොයා ගෙන නොතිබුණි, ''අපේ අඳුරු පැත්තට පහර දෙන්න, පැහැදිලිව සහ සියලුම ආකාරයෙන් පහර දෙන්න.''

# චීනයේ මුවහත් පංති අරගලය

ආයෝජන ප්‍රමුඛතා තීරණය කිරීම සඳහා, පක්ෂයේ ගතානුගතික බලවේගයන්ට ලාභය මැනීමට අවශ්‍ය වුණි. ඔවුහු වරප්‍රසාද භුක්ති විඳින වෘත්තිකයින් හා පක්ෂයේ ඉහළ කොටස් තැනීමට අධ්‍යාපනයට අනුබල දුණි. තවමත් පැරැණි රදළ අදහස් සහ චරිත මගින් පාලනය කරන සංස්කෘතික වැඩ ඔවුහු ඉදිරියට දැමූහ. ඔවුන්ගේ මූලික ප්‍රවේශය වූයේ කම්කරුවන්ට සහ ගොවියන්ට, ''ඉස්පාසුවක් නැතිව වැඩ කරන්න, ලෝකය පුරා විප්ලවයට කොටස් කාරයෙකු වීම සහ සමාජයේ සියල්ල පරිවර්තනය කරන සහ එය දිව යන ආකාරයේ ලොකු ප්‍රශ්න ගැන අමතක කරන්න'' යන්නයි.

මේ සියලුම සංකීර්ණතාවයන් තුළ ඔහුගේ ශ්‍රේෂ්ඨතම ඉගැන්වීම ඇති කළේය. **නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ විප්ලවය අඛණ්ඩව ගෙනයාමේ** න්‍යාය සහ භාවිතය යි.

සමාජවාදී සමාජය තුළ පරාජිත ධනේශ්වර පංති බලවේගයන්ට විරුද්ධව දිගටම අරගලය ගෙනයන්ට නිර්ධන පංති ආඥාදායකත්වය නුඹට අවශ්‍ය වේ. සමාජවාදී සමාජය නිති පතා විප්ලවීයකරණය වුවත්, ඉතිරිවී තිබෙන සමාජ අසමානතාවයන් සහ වෙනස්කම් ධනේශ්වර පංතියට පදනමක් සැපයීම සිදුකර ගෙන යයි. පසුබෑමක් ඇති කිරීමට, ධනවාදී සම්බන්ධතාවයන් සහ සිතිවිලි, ධනවාදී සමාජ ක්‍රමයට පදනමක් සපයයි. පැරැණි සමාජයේ පීඩකයෝ සහ සූරාකන්නෝ මහත් අනතුරුදායක නොවන බවත්, සමාජවාදී සමාජය තුළින්ම සියුම් ප්‍රතිවිරෝධයන්ගෙන් උපදවන ලද නව ධනේශ්වර පංතියක් පක්ෂයේ ඉහළම මට්ටම්වල කේන්ද්‍රගතවී සිටින බවත් මාඕ වටහා ගති.

පක්ෂ නායකයෝ ඔවුන්ගේ තනතුරු වල බලය නිසා ස්ථිර ලෙසම සමාජයේ ගමන් මග තීන්දු කිරීමට, සම්පත් පාලනය කරයි, තීරණ ගනියි, ප්‍රතිපත්ති සංවර්ධනය කරයි. ඔවුන් බලය පාවිච්චි කරන ආකාරය සහ අභිමතාර්ථයන් සමග **සමාජය සම්පූර්ණ වශයෙන් ධනවාදයට ආපසු යන්ට හෝ කොමියුනිස්ට්වාදය දෙසට ඉදිරියට ගමන් කරනවාද** යන කොන්දේසි සියල්ල සාදයි. උදහරණ ලෙස පක්ෂ නායකයෝ අසමානතාවයන් කඩා දමන හෝ ඒවා ශක්තිමත් කරන ප්‍රතිපත්ති වලට සහයෝගය දෙමින් සිටීද? ඔවුහු සමාජය පරිවර්තනය කිරීම සඳහා සටන් කිරීමට ජනතාවට සවිඥානික මුල පිරීමක් ඇති කිරීමට වැඩ කරයිද? මෙය සමාජවාදය යටතේ සිදු වන පංති අරගලයේ සාරයයි. සමාජවාදී සමාජයේ උත්තර නිර්මිතයේ, නීති, කලාව, සංස්කෘතිය, ක්‍රීඩා, විද්‍යාව සහ දේශපාලන ආයතනවල පංති ප්‍රතිවිරෝධයන් පරාවර්තනය කරනවා පමණක් නොව එකක් හෝ අනිකක් තුළ ඒවා විශාලව බල පවත්වනු ඇත.

මාඕට සමාජය සම්පූර්ණයෙන්ම සොලවන්ට ක්‍රමයක් සොයාගන්ට අවශ්‍ය විය. සමාජයේ සියලුම ආයතන සහ පක්ෂය විප්ලවීයකරණය කරන්ට, ජනතාවගේ සිතුවිලි සහ ඔවුන් වටහා ගන්නා අයුරු පරිවර්තනය කරන්ට, මෙන්ම චීනය සමාජවාදී මාවතේ තබා ගන්ට සහ පංති අරගලයට පුලුල්ව බහු ජනතාව සම්පූර්ණයෙන්ම ආකර්ෂණය කරගැනීමට ක්‍රමයක් ඔහුට අවශ්‍ය විය.

# සමාජවාදී මාවතේ තබාගන්ට අරගලය

1927 දී මාඕගේ නායකත්වය යටතේ රතු හමුද භටයින් 800 ක් සමග මහ ජන යුද්ධය ඇරඹුණු පළමු රතු මූල ප්‍රදේශය වූ චින්කාන් කඳු වැටියට 1965 ග්‍රීෂ්ම ඍතුවේදී මාඕ සංචාරයක් කළේය. මෙය භයානක කාලයක් විය. නැවත ධනවාදය ස්ථාපිත කරන්ට උවමනා වුණු විප්ලවයේ සතුරෝ බලය අත්පත් කර ගැනීමට මුළු ශක්තියෙන්ම සටන් කිරීමට සූදනම් වෙමින්, ඔවුන්ගේ ශක්තිය රැස් කරමින් සිටියහ. අනතුරුව ''චින්කාන්ෂාන් නැවත නගිමින්'' පද්‍ය පංතිය මාඕ ලීවේය.

වළාකුළු වෙතට දිව යන්න මහත් පැතුමක් මට තිබේ,
මම නැවත චින්කාන්ෂාන් තරණය කරමි.
දුරින් ඇදී එන අපේ පැරණි අවතාර දැකීමට,
පැරැණි දෑ ඉවත් කරමින් මම නව දර්ශනයන් සොයා යන්නෙමි.
සිවුරු හොරා සැම තැනම ගී ගයයි.
වැහි ලිහිණියන් විත් වේගයෙන් වදින දිය කඳුරු කොඳුරයි.
මාවත අහස දෙසට නැග යෙයි.
හුවාංයංචී පහු විය,
උපද්‍රවයක සේයාවක් හෝ ඇති තැනක් නැවත හමු නොවේ.

සුළඟින් සහ අකුණුවලින් ඇළලී යයි.
කොහේ හෝ මිනිස්සු ජීවත් වෙත්ද,
එතැන දද සහ පතාක ලෙළ දෙයි.
තිස් අට වසරක් පසු වී ඇත,
යන්තම් ඇඟිලි හිරි ඇරෙයි.

සුරලෝ නවයෙහි චන්ද්‍රයන් අල්ලා ගැනීමට,
ගැඹුරු පංච මහා සමුද්‍රයේ කැස්බෑවුන් ඇල්ලීමට අපිට පුළුවන.
විජයග්‍රාහී ගීත සහ ප්‍රහර්ෂයන් මැද අපි නැවත යන්නෙමු.
**නුඹ මුදුනටම නගින්ට නිර්භීත වෙන්නේ නම්,**
**මේ ලෝකයේ අමාරු කිසිවක් ම නැත.**

**(1965 මැයි)**

''මධ්‍යස්තානයට බෝම්බ දමන්න'' ජනතාවට ආයාචනය කරමින් 1966 මැයි වලදී මාඕ ශ්‍රේෂ්ඨ සංස්කෘතික විප්ලවය දියත් කළේය. ධනවාදයට ආපසු ගෙන යන්ට උත්සාහ කරන රජයේ නිළධාරීන් සහ පක්ෂ මුදුන අතුගා දමන්ට නැගී සිටින්නැයි දශ ලක්ෂ සිය ගණනක්වූ ජනතාවට මාඕ ආමන්ත්‍රණය කළේය. **මෙය විප්ලවය තුළ විප්ලවයක් විය.**

සමාජ ඉරණම සඳහා වගකීම බාර ගන්ටත්, සමාජය පුරා වාද විවාද කරන්ටත්, අරගල කරන්ටත් කෝටි ගණන් ජනතාවට මාඕ ඉඩ ලබා දුණි. කොමියුනිස්ට් වාදයෙන් පලා ගිය ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින්, නායකත්වය දෙමින් සිටි ධනවාදී මග ගත්තන් හඳුනා ගැනීමට, විවේචනය කිරීමට, ඔවුන්ගේ මුදුන බිඳ හෙලීමට සහ ඔවුන් සතු රාජ්‍ය බලයේ අංශයන් නැවත උදුරා ගැනීමට, මාඕ සහ පක්ෂයේ

විප්ලවීය නායකත්වය, ජනතාව උසස් තලයකට ගෙන ඒමට සටන් කළහ. මෙය ජනතාවගෙන් වැඩි කොටසකට බලය ලබා දෙමින්, සමාජය තව දුරටත් විප්ලවීයකරණය කළ ක්‍රියාවලියක් වූහ.

පෙනෙන විදිහට චීන ඉතිහාසය තුළ, සංස්කෘතික විප්ලවය සහ මාඕගේ නායකත්වය, **වරදවා වටහාගත් සහ වඩාත්ම විකෘති කළ කාල පරිච්ඡේදයකි**. දැන් දශක කිහිපයක්ම ධනවාදීන්ගේ ආරක්ෂකයෝ සංස්කෘතික විප්ලවය සිහිනයක් ලෙස පෙන්වන අතර මාඕට අපවාද කරන සම්පූර්ණ පටු මුසා බවට පත් කොට ඇත.

## සමාජවාදී නව තත්ත්වයන් තව දුරටත් සමාජය පරිවර්තනය කිරීම

මාඕ පසු ව පැහැදිලි කළ පරිදි සංස්කෘතික විප්ලවයේ ඉලක්කය ධනවාදී මාවතේ ආධිපත්‍ය ගත් පුද්ගලයින් විය. අරගලයේ උපායික අභිප්‍රාය තව දුරටත් කොමියුනිස්ට් ලෝකයක පාලනය ඒ වටා සමාජය පරිවර්තනය කරන්ටත් ඒ ඔස්සේ බහු ජනතාවගේ ලෝක දෘෂ්ඨිය පරිවර්තනයට උදවු කිරීමයි.

සෞඛ්‍ය ආරක්ෂාව බලන්න. 1949 දී දශ ලක්ෂ පන්සීයක රටක, බටහිර පුහුණුව ලැබූ වෛද්‍යවරුන් 12,000 ක් පමණ සිට ඇත. 1965 වන විට එහි 200,000 සිටියහ. නමුත් වැඩිම වෛද්‍ය පහසුකම් නගරවල කේන්ද්‍රගත විය. උසස් නාගරික රෝහල්වල වැඩ කරන්ට සහ ඔවුන් සඳහා ම වෘත්තියක් සෑදීමට අලුත් වෛද්‍යවරුන්ව පොළඹවා තිබුණි. ඒ අතර චීන ජනගහණයෙන් අති විශාල බහුතරයක් වූ ගොවි ජනතාවගෙන් බොහොමයකට නවීන වෛද්‍ය පහසුකම් යාන්තමින් හෝ නැතිනම් කොහෙත්ම නොතිබුණි. සෞඛ්‍ය පහසුකම් වලට එවැනි ප්‍රවේශයක් ලැබුණේ ප්‍රබල ධනවාදී බලපෑම මගින් සමාජය තුළ පුළුල් අසමානතාවයන් ඇති කරන්ට උදවු දී තිබුණු බැවිණි.

*සංස්කෘතික විප්ලවයේදී, රතු ආරක්ෂකයෝ ප්‍රචාරක කටයුතු වල යෙදෙමින්.*



වේගවත් පරිවර්තනයක් ඉල්ලමින් මාඕ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රියා මාර්ගය තියුණු ලෙස විවේචනය කරන්ට ඔවුන්ව රැස් කළේය. ඔහුගේ නායකත්වය යටතේ නගරවල දියුණු කරන ලද සෞඛ්‍ය පහසුකම් සම්පූර්ණයෙන්ම ගම්බදට වාර ක්‍රමයට කේන්ද්‍ර කළේය. සංස්කෘතික විප්ලවයේ වඩාත්ම සංවර්ධිත උද්දීපනයක් වූයේ ''පාවහන් රහිත වෛද්‍යවරයා'' ව්‍යාපාරය යි. තරුණ ගොවීන්ට සහ නාගරික තරුණයින්ට මූලික සෞඛ්‍ය පුහුණුව සහ නිතර මුණ ගැසෙන ප්‍රාදේශීය අවශ්‍යතාවයන්ට සහ වඩාත්ම පොදු රෝග සඳහා අවශ්‍ය සෞඛ්‍ය ආම්පන්න ලබා දී ගම්බදට පිටත් කර හරින ලදි. දෙනු ලැබූ ඕනෑම වේලාවක වෛද්‍යවරු ගම්බදට ගියෝය. නාගරික වෛද්‍යවරුන්ගෙන් තුනෙන් එකක් ගම්බද සිටියහ. 1949 දී අවුරුදු 32 ක් වූ ජීවිතාපේක්ෂාව 1976 වන විට, මාඕගේ කාලය තුළ අවුරුදු 65 දක්වා දෙගුණ විය.

අධ්‍යාපනයේදී නායකත්වය දුන් ධනවාදී මග ගත්තෝ, නවීන රටක් බවට චීනය ගොඩ නගන්ට හොඳම පාසැල් සහ දක්ෂ සිසුන් පිළිබඳ මූලික අවධානය යොමු කිරීම අවශ්‍ය බවට තර්ක කරමින් සිටියහ. කුඩා කම්හල් පාසැලට සම්බන්ධ කර වැඩ කිරීම සහ පොදුවේ ආහාර බෙදා හදා ගැනීම, සිසුන් පැසැලේදී බෝග වගා කරමින් ඔවුන්ගේ කාලයෙන් කොටසක් වැය කරන, ශ්‍රේෂ්ඨ ඉදිරි පිම්ම කාලයේ අභ්‍යාස අවසන් කළ යුතු බවට ඔවුහු තර්ක කළහ. පොදු මහ ජනතාව සහ විශේෂඥයන් අතර, බුද්ධිමය සහ කායික ශ්‍රමය අතර වෙනස්කම් ඔවුන් පළල්ව කඩා දමන්නේ නැතිනම් කොමියුනිස්ට්වාදය දෙසට, ඉදිරියට ගමන් කළ නොහැකි බව පෙන්වා දෙමින් විප්ලවවාදීහු මෙය තියුණුව විවේචනය කළහ.

උසස් අධ්‍යාපනයේ ඉතා උසස්ම කොටසට විරුද්ධව දශ ලක්ෂ ගණන් සිසුන් දිගටම අරගලය ගෙන යා යුතු බව අධ්‍යාපනයේ පරිවර්තනයට මාඕ හඬගෑමේ ප්‍රතිඵලයක් විය. සංස්කෘතික විප්ලවයට පෙර විශ්ව විද්‍යාලවල අනිකුත් වරප්‍රසාද ලත් සහ පක්ෂ සාමාජිකයන්ගේ දූවරුන්ගේ සහ පුත්‍රයන්ගේ මණ්ඩල වූහ. සිසුහු තොරාගන්නා ලද පාසැල් වලට ඇතුලත්වීම සඳහා, විභාග සම්පූර්ණ කිරීම වැඩි විය. ශතවර්ෂ ගණනක්ම චීනයේ රදළ කොන්ෆියුසියානු අධ්‍යාපන ක්‍රමය වරප්‍රසාදලත් කුඩා විශේෂිතයන් නිර්මාණය කර තිබුණි. එය සමාජයේ නිෂ්පාදන ශ්‍රමයෙන් සහ පොදු ජනතාවගෙන් ඈත් කර තිබුණි. තරඟ විභාග සහ විශේෂිත ක්‍රම සහිත මෙම ක්‍රමය සංස්කෘතික විප්ලවයෙන් විනාශ කර දැමීය. උසස් පාසැල් වලින් අධ්‍යාපනය ලැබූ සිසුහු ෆැක්ටරිවල වැඩ කරන්ට හෝ ගම්බද ප්‍රදේශවල වැඩ කරන්ට, ජීවත්වෙන්ට ගියෝය. කිසියම් පසු බිමක සිසුන්ට අවුරුදු දෙකකට හෝ තුනකට පසු විද්‍යාලවලට යාමට ඉල්ලුම් කිරීමට පුලුවන. විද්‍යාලවලට ඇතුලත් කර ගැනීමේ දී අපේක්ෂකයාගේ ප්‍රජා සම්බන්ධතාවයන් සහ සාමූහිකව වැඩ කිරීමේ හැකියාව විනිශ්චයට ලක් විය.

අනුරූපව ''සමාජවාදී නව සිද්ධීහු'' ඔවුනොවුන්ම විප්ලවීයකරණය කිරීමට සහ සමාජයම විප්ලවීයකරණය කිරීමට, මාඕගේ හඬ ගෑමට පිළිතුරු වශයෙන්, සමාජයේ සෑම කොටසකින්ම, ජනතාව ඉදිරියට රැගෙන ආවේය.

මෙහි තීරක කොටසක් වශයෙන් පක්ෂය විසින්ම විප්ලවීයකරණය වීමට පටන් ගත්තේය. කොමියුනිස්ට් අරමුණු සහ සමාජවාදී පරිවර්තන කාලය ගැන

සිය අවබෝධයේ තත්ත්වය උඩ පක්ෂයේ සෑම ඒකකයක්ම මෙම විප්ලවීය මාර්ගයට අවතීර්ණ වී සෑම අවස්ථාවකදී ම පරිවර්තනයට නායකත්වය ලබා දුණි. මේ ඇවිස්සුණු සහ විප්ලවීය අවස්ථාවේදී නව විප්ලවීය නායකයෝ ජනතාව අතරින් ඉදිරියට පැමිණියහ. බොහෝ අය පක්ෂයට එක් වූහ. පක්ෂයට සම්බන්ධවුණු කාඩර්වරුන් අතර තමන්ම ප්‍රශ්න විචාරීමට සහ විවේචනයට, විවෘතභාවයේ ආත්මයක් හද වඩා ගනිමින්, බහුජනතාවගේ මුල පිරීමට ඉඩ හරිමින්, විශ්‍රාන්තභාවය නගා සිටුවමින්, පරිවර්තනය සහ විප්ලවීය රැළි ඔස්සේ බහුජනතාව සහ පක්ෂ කාඩර්වරු අතර සම්බන්ධතාවයන් ඇතිවුණි.

## සමාජවාදී චීනය අහිමිවීම සහ අනාගතය සඳහා පාඩම්

මාඕ ප්‍රකාශ කළ පරිදි, අධිරාජ්‍යවාදයේ පීඩනයත්, එහි ඉතිරි වී ඇති ධනවාදයේ උපන් ලපත් (උදා:- ගම සහ නගරය අතර අසමානතාවයන්, මානසික ශ්‍රමය හා කායික ශ්‍රමය අතර වෙනස්කම් ආදිය), පක්ෂයේ බලසම්පන්න නායකයින් සමහරක් තවමත් සංස්කෘතික විප්ලවයේ මාවත වෙතට සම්පූර්ණයෙන්ම දිනා නොගැනීමත් සහ සත්‍ය ලෙසම එයට එරෙහි ගැඹුරු ප්‍රතිවිරෝධයන් තවමත් ආරක්ෂිතව ඇති නිසාත්, ධනවාදී ක්‍රමය නැවත ඉදි කිරීම ඉතා පහසුය.

1976 මාඕ මිය ගිය පසු, චීනයේ ධනවාදී මග ගත්තන්ට නායකත්වය දුන් ඩෙන් ෂියාඕපිං ඇසිල්ලකින් ඇති කළ කුදෙතාවකින් (කුමන්ත්‍රණයකින්) බලය අත් පත් කර ගත්හ. මාඕගේ බිරිඳ චියෑං චිං ඇතුළුව ''සතර දෙනාගේ කණ්ඩායම'' ලෙස හැඳින්වූ මාඕගේ සමීපතම සහෝදරවරු ඇතුළුව දස දහස් ගණනක් අත් අඩංගුවට ගැණුනි. දහස් ගණනකට අධික පිරිසක් මරා දැමුණි. ''ජනතාවට සේවය කරන්න'' මාඕ කියා ඇත, ''පොහොසත්, සමෘද්ධිමත් තත්ත්වයකට පත්ව ඇත,'' ඩෙන් ෂියාඕපිං පුරසාරම් දෙඩීය. කුමන්ත්‍රණයක් මගින් සමාජවාදී චීනය විනාශකොට එය අපායකට ඇද දැමුණි. අද නැවත වරක් අති විශාල ලෙස සියල්ලටම ඉහළින් අධිරාජ්‍යවාදය බල පවත්වන අතර ධනවාදී සූරාකෑම සහ ඊට පසු පසින් රදළ පීඩනය සමග සීමාන්තික ආර්ථික සහ සමාජ ධ්‍රැවීයකරණය බල පවත්වයි.

විශාල ජාත්‍යන්තර තත්ත්වයන් සමග වෙලී තිබූ සංවර්ධනය සහ එය චීනයේ පංති අරගලය විනිවිද ගිය ආකාරය ධනවාදී මග ගත්තන්ගේ සාර්ථකත්වයට හේතු විය. මාඕ සිදු කළ එක් වරදක් විය, විශේෂයෙන්ම මාඕ මිය ගිය පසු ඔහු වටා සිටි විප්ලවවාදී කණ්ඩායම්වලට, ප්‍රහාරයක් වැදුණු විට, දුර්වල වන ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට ක්‍රමයක් සකසා තිබුනිද?

නමුත් මෙයින් සමාජවාදය අසමත් බව (කළ නොහැකි බව) චිත්‍රණය නොකරයි. විප්ලවය අසමත් නැත. එය පරාජය වී ඇත. සමාජවාදය සහ මාඕවාදය යන වචනවලින්, ඔවුන්ව ආවරණය කර ගත් නිසා අඩුම තරමින් ඒ කාලයේ දී ධනවාදී මග ගත්තන් විසින් බලය අල්ලා ගැණුනු බව වත් පැහැදිලි නොවුණි. ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ මෙම භාරදූර සංධිස්ථානයේදී කොමියුනිස්ට් විප්ලවයේ භාවිතාව සහ විද්‍යාවට මාඕ ලබා දුන් දායකත්වය **බොබ් අවේකියන්**

ගැඹුරින් සමාලෝචනය කළේය. ඔහු චීනයේ අළුත් නායකත්වයේ චරිත ස්වභාවය විග්‍රහ කර මාඕට සහ සමාජවාදයට විරුද්ධව ප්‍රති විප්ලවයක් සිදු කර තිබෙන බව කරුණු සහිතව පෙන්වා දුන්ණේය. තව දුරටත් ලෝකයේ විප්ලවීය වැඩ පිළිවෙල, තව දුරටත් උසස් තත්ත්වයට ගෙනෙන්ට, ඉගෙන ගන්ට පුලුවන් හැකි තරම් ඉගෙන ගන්ටත් එයට නායකත්වය දෙමින් ඒ තුළින් මාඕ සංවර්ධනය කළ න්‍යායන් ලෝක ඓතිහාසික චීන විප්ලවයේ පෙර නුවූ අත්දැකීම් නිවැරදිව සමාලෝචනය කරන්නටත් ලෝකය පුරා සැබෑ කොමියුනිස්ට්වාදීන් ඉදිරියේ අභියෝග සහ කාර්යයන් එවෙලෙහි ඔහු පෙන්වා දුන්නේය.

අද ලෝකයේ කිසිදු සමාජවාදී රටක් නොමැත. 1976 සමාජවාදී චීනය අහිමිවීම ලෝක නිර්ධන පංති විප්ලවයේ පළමු රැල්ලේ අදියරක අවසානය සලකුණු කළේය.

අධිරාජ්‍යවාදී පීඩකයන්ගේ ග්‍රහණයෙන් චීන ජනතාව නිදහස් කර ගැනීමට, විසි පස් වසරක් පුරා විමුක්තිය වෙත ගමන් කිරීමට, සමාජවාදී සමාජය ගොඩ නැගීම සඳහා මේ ග්‍රහලෝකයේ ජන ගහණයෙන් හතරෙන් එකකට නායකත්වය ලබා දුන් මාඕ සේතුං ශ්‍රේෂ්ඨ විප්ලවවාදියෙක් විය. ඔවුන්ගේ ජීවිත වල තත්ත්වයන් විප්ලවීය ලෙස වෙනස් කරන්ට සහ මේ ක්‍රියාකාරීත්වය තුළින් ඔවුන්ටම වෙනස් වීමට, ''වසන්ත සමාජය ගුවනට ගැනීමට'' චීන ජනතාවට ඔහු නායකත්වය දුන්නේය. නව ධනේශ්වර පංතියක බලය අත්පත් කර ගැනීම වැළැක් වීමට ක්‍රමයක් සොයා බලා ඔහු ගේ අවසාන හුස්ම හෙළන තෙක්ම මේ සටන තුළ ජනතාවට මාඕ නායකත්වය දුන්නේය. ඉතා ඈතින් වූ මිනිස් ප්‍රජාව පීඩනය සහ සූරා කෑමෙන් නිදහස් ලෝකයක් තුළට ගෙනෙන්ට, ඔහුගේ නායකත්වය යටතේ ජනතාව පරිවර්තනය කරමින්, සමාජය පරිවර්තනය කරමින් සිදු කළ වඩාත්ම උසස් විප්ලවීය අත්දැකීම මෙය විය.

මාඕ පිළිබඳව සත්‍ය දැන ගැනීම සෑම කෙනෙකුටම වැදගත්ය, ඔහු නායකත්වය දුන් විප්ලවය මිනිස් ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් වන අතර එම විප්ලවය සහ එහි ස්වභාවය පිළිබඳව සත්‍ය සෑම කෙනෙකුම දැන ගත යුතුය. සැබැවින්ම ලෝකය වෙනස් කරන්ට අවශ්‍ය අයට, නව විප්ලවීය ව්‍යාපාරයක් ගොඩනැගීමට, මාඕගේ විප්ලවීය චින්තනය සහ අපගමනයන්ගේ හා ප්‍රතිෂ්ඨාපනයේ වැදගත් ස්ථානයන්හි ප්‍රායෝගික ආකාරයන්, බොහොමයක් ඇත.

පරිවර්තනය
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
අංක 06

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com

කිසිවක්

නොබෙදුණු, නොවැසුණු, නොනවතින,

මිනිසා විසින් මිනිසෙකු සූරා කෑමෙන් තොර, කොමියුනිස්ට්

ලෝකයක් වෙනුවෙන් සටන් වදින,  දශ ලක්ෂ සංඛ්‍යාත

නිර්ධන පංතික සහෝදර සහෝදරියනි,

ඔබගේ ආදරණීය නාමය

වෙනුවෙනි..!